MadhuraGeet

Touch through music

# Sinhala Lyrics Collection

## Volume 2

### 100 songs

Compiled By

Chandra B. Gamlath

St. Louis, Missouri

USA

2004

## Table of Contents

101 - බර බාගෙ - සී. ටී. ප්‍රනාන්දු ..... 5
102 - අම්බිලි මාමේ - සී. ටී. ප්‍රනාන්දු ..... 6
103 - අව්දිවන්න අව්දිවන්න - සී. ටී. ප්‍රනාන්දු ..... 7
104 - සීගිරි සුකුමාලියේ - සී. ටී. ප්‍රනාන්දු ..... 8
105 - සුවඳ රෝසමල් - සී. ටී. ප්‍රනාන්දු ..... 9
106 - රන්වන් රන් කෙඳි- සී. ටී. ප්‍රනාන්දු ..... 10
107 - සඳවට රන්තරු - සී. ටී. ප්‍රනාන්දු ..... 11
108 - මිහිඳුම් සළු තිර - සුනිල් එදිරිසිංහ සහ නීලා වික්‍රමසිංහ ..... 12
109 - නිම් තෙරක් නොදුටු - සුනිල් එදිරිසිංහ ..... 13
110 - පලංචියේ ලී ඉරුවේ - සුනිල් එදිරිසිංහ ..... 14
111 - තිරය ඇරෙනවා - සුනිල් එදිරිසිංහ ..... 15
112 - අන්න බලන් ඉදිකඩ ලඟ - දීපිකා ප්‍රියදර්ශනී ..... 16
113 - නිම් හිම් සෙව්වා - අමරදේව ..... 17
114 - කුමරියක පා සළඹ - අමරදේව ..... 18
115 - විකසිත පෙම් - අමරදේව ..... 19
116 - හෙළ ජාතික අභිමානේ - සී. ටී. ප්‍රනාන්දු ..... 20
117 - අනේ ඩිංගක් ඉන්නකෝ - සී. ටී. ප්‍රනාන්දු ..... 21
118 - පියුමෙහි පැණි බොති - සී. ටී. ප්‍රනාන්දු ..... 22
119 - පුන් සඳ හිනැහෙන්නේ - සී. ටී. ප්‍රනාන්දු සහ රුක්මණී ..... 23
120 - කුමටද සොබනියෙ - නරි බෑනා ..... 24
121 - සුරතලියේ සුකොමලියේ - මොහිදීන් බෙග් ..... 25
122 - සිහින ගෙනෙන - ක්ලැරන්ස් විජේවර්ධන ..... 26
123 - සඳක් බැස ගියා - ක්ලැරන්ස් විජේවර්ධන ..... 27
124 - සිහින ලොවක් - ක්ලැරන්ස් විජේවර්ධන ..... 28
125 - මලට බඹරෙකු සේ - ක්ලැරන්ස් විජේවර්ධන ..... 29
126 - කිරි මුහුද කලඹාලා - ක්ලැරන්ස් විජේවර්ධන ..... 30
127 - සුරඟන වෙස් වලා - ක්ලැරන්ස් විජේවර්ධන ..... 31
128 - මාස්ටර් සර් - නීලා වික්‍රමසිංහ ..... 32
129 - දස්කොන් සකි සඳ - නීලා වික්‍රමසිංහ ..... 33
130 - සුසැට බරණින් - නීලා වික්‍රමසිංහ ..... 34
131 - ලෝ අඬ නින්දේ - සී. ටී. ප්‍රනාන්දු ..... 35
132 - මගෙ සුදු මාමේ - සී. ටී. ප්‍රනාන්දු ..... 36
133 - මිරිවැඩි සඟලක් - නන්දා මාලිනී ..... 37
134 - සකුරා මල් පිපිලා - නන්දා මාලිනී ..... 38
135 - පොඩි කුමාරිහාමියේ - වික්ටර් රත්නායක ..... 39
136 - නිල් මානෙල් - අමරදේව ..... 40
137 - ආදරයේ උණුසුම ලඟ - සෝමතිලක ජයමහ ..... 41
138 - විල් තෙරේ පියුම් පිපී - සෝමතිලක ජයමහ ..... 42
139 - නව දැලි හේනක - සෝමතිලක ජයමහ ..... 43
140 - බිම්බරක් සෙනග - ගුණදාස කපුගේ ..... 44
141 - පිපී පිපී රේණු නටන - නාරද දිසාසේකර ..... 45

142 - පින් සිදුවන්නේ - සී. ටී. ප්‍රනාන්දු ..... 46
143 - ගලන ගඟකි ජීවිතේ - නාරද දිසාසේකර - නන්දා මාලිනී ..... 47
144 - ඕලු නෙළුම් නෙරිය රඟාලා - සිසිර සේනාරත්න ..... 48
145 - ශාන්ත මේ රෑ යාමේ - අමරදේව ..... 49
146 - කිමද නාවේ - ඉන්ද්‍රාණි පෙරේරා ..... 50
147 - හෝ ගා රැල්ල බිඳේ - සුනිල් ශාන්ත ..... 51
148 - කෝකිලයන්ගේ කෝකිල නාදේ - සුනිල් ශාන්ත ..... 52
149 - දිය ගොඩ සැමතැන - සුනිල් ශාන්ත ..... 53
150 - ඕලු පිපීලා - සුනිල් ශාන්ත ..... 54
151 - සුවඳ රෝස මල් නෙලා - සුනිල් ශාන්ත ..... 55
152 - ඔබේ නමින් සෑය බඳිමි - අමරදේව ..... 56
153 - මළ ඉරූ බසිනා - අමරදේව ..... 57
154 - සොර දෙටුවෙක් - සුනිල් එදිරිසිංහ ..... 58
155 - මේ ගුරු පාරේ - අමරදේව ..... 59
156 - ඉපිද මැරේ - අමරදේව ..... 60
157 - මින් දද හී සර - අමරදේව ..... 61
158 - ඇවිළුණු ගිනිදැල් - සනත් නන්දසිරි ..... 62
159 - මා හද අසපුව - සනත් නන්දසිරි ..... 63
160 - මුදු පතුල යට ඉඳලා - මුදු පුත්තු ..... 64
161 - චන්ද්‍ර මඩුළු යට - නන්දා මාලිනී ..... 65
162 - පාවෙලා නිල් වලාවේ - අමරදේව ..... 66
163 - චන්දන ඇඟ ගාලා - සිසිර සේනාරත්න ..... 67
164 - කිරි පුස්සා - සෙක්කුව ..... 68
165 - කඩේට පලයන් - තාරාවෝ ඉගිලෙති ..... 69
166 - සුවඳ සබන් ඇඟ ගාලා - රවින්ද්‍ර යසස් ..... 70
167 - සිරියාමෙ සාරා - එච්. ආර්. ජෝතිපාල ..... 71
168 - මංගෝ කලු නැන්දේ - ඇනස්ලි මාලේවන ..... 72
169 - රස ආහර කවලා - එම්. එස්. ප්‍රනාන්දු ..... 73
170 - අඬවන්වූ දෙනෙතින් - අමරදේව ..... 74
171 - පරම රමණී - මොහිදීන් බෙග් සහ රුක්මණී ..... 75
172 - මගෙ රත්තරන් හෙලේනා - රෝහණ බැද්දගේ ..... 76
173 - මහද නමැති වනබඹරා - එච්. ආර්. ජෝතිපාල ..... 77
174 - සීත සුනිල් දිය දහරා - එච්. ආර්. ජෝතිපාල ..... 78
175 - කාගෙද ගොන්වස්සා - මූන්ස්ටෝන්ස් ..... 79
176 - පිදුරු සෙවිකල - සිසිර සේනාරත්න ..... 80
177 - චන්ද්‍රා මේ රෑ පායා - එච්. ආර්. ජෝතිපාල ..... 81
178 - සඳ හිරු තරු - වික්ටර් රත්නායක ..... 82
179 - සිරිපාදේ සමනොල - වින්සන්ට් පෝල් පීරිස් ..... 83
180 - රාණී එන්කෝ - මොහිදීන් බෙග් සහ රුක්මණී ..... 84
181 - ටිකිරි මැණිකෙ - මොහිදීන් බෙග් ..... 85
182 - දිසාපාමොක් ඇදුරු තුමනී - ටී. එම්. ජයරත්න ..... 86
183 - ගමෙන් ලියුමක් - ක්ලැරන්ස් විජේවර්ධන ..... 87
184 - හන්තානේ කඳු - අමරදේව ..... 88



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

185 - සාරි පොඩිත්තක් - නන්දා මාලිනී ..... 89
186 - හිරුගෙ ලොවේදී - ක්ලැරන්ස් විජේවර්ධන ..... 90
187 - සුදූ හාමිනේ - නන්දා මාලිනී ..... 91
188 - සන්නාලියනේ - අමරදේව ..... 92
189 - පැලේ වසන රන්මලී - සිඩ්නි ආටිගල ..... 93
190 - උඩරට කඳුකර - චිත්‍රා සෝමපාල ..... 94
191 - මුව හසරැලි සාගරේ - ක්ලැරන්ස් විජේවර්ධන ..... 95
192 - සුදූ සඳ රැස් ගලන - මොහිදීන් බෙග් ..... 96
193 - සිරි යහනේ - එඩ්වඩ් ජයකොඩි ..... 97
194 - අකුරු මැකී නෑ - එඩ්වඩ් ජයකොඩි ..... 98
195 - රන් ටිකිරි සිනා - ටී. එම්. ජයරත්න ..... 99
196 - බිඳූ බිඳූ රන් - අමරදේව ..... 100
197 - චන්දන ඇල්ලෙන් නාලා - එච්. ආර්. ජෝතිපාල ..... 101
198 - පින්න මලේ සුද - එඩ්වඩ් ජයකොඩි ..... 102
199 - රෑ පැල් රැකලා - සී. ටී. ප්‍රනාන්දු ..... 103
200 - කුන්ඩුමණී - ෆ්‍රෙඩී සිල්වා ..... 104

101 - බර බාගේ - සී. ටී. ප්‍රනාන්දු

තණ්ඩලේ දෙන්න දෙපොලේ දක්කනවා
කටු කැලේ ගාලෙ නොලිහා වද දෙනවා
බර බාගේ බර බාගේ //
දුටුවේ සිහිවේ පෙර කාලේ
(අර කින් කිණි නද වැල පැතිරෙනවා
ගව කුර හඬ මුසු වෙනවා) //

රෑ මැද කාලේ සීපද තාලේ //
අඬ නින්දේ පතුරන්නේ
රාලද ගෝනි පඩංගුවෙ ඉන්නේ
සතුටිනි ගැල පදවන්නේ
බර බාගේ බර බාගේ

(ගෝනි පුරා බඩු බාගේ දමාලා) //
රෑ කල ඈත බලාලා
(ගාල ලිහා ගොනුගේ කුසයේ ගිනි
නිවමිනි උදය කලා)//

බර බාගේ බර බාගේ - බර බාගේ බර බාගේ
දුටුදේ සිහිවේ පෙර කාලේ
අර කින් කිණි නද වැල පැතිරෙනවා
ගව කුර හඬ මුසු වෙනවා
x

102 - අම්බිලි මාමේ - සී. ටී. ප්‍රනාන්දු

(අම්බිලි මාමේ ඔබ මොකද කරන්නේ) //
පුළුන් වලා යටින් ඉඳන් එබිලා බලන්නේ
වටින් පිටින් ඇදෙන්නේ මුහුණ ඔබේ පෙනෙන්නේ
සේද යොදා සැදූ වලා සලුද කියන්නේ
(පාත බලන්නේ මුව විහිදන්නේ
රිදී සිනා පපා මෙලෝ එලිය කරන්නේ)//

අම්බිලි මාමේ ඔබ ...

සිසිල් සුලං හමන්නේ කුමුදු සමන් පිපෙන්නේ
අඳුරු කලා දසත බලා පැනලා දුවන්නේ
(තුරු නැලවෙන්නේ සුවඳ හමන්නේ
කුසුම් තලා රේණු සලා බිම සරසන්නේ)//

අම්බිලි මාමේ ඔබ ...

සියල් සතුන් නිදන්නේ සුරන් මෙලෝ වඩින්නේ
ගුවන් කුසේ මැණික් රසේ ඔබ සරසන්නේ
(සිරස සදන්නේ රැස් පලඳන්නේ
සුපුන් සඳේ ඔබ නිබඳේ ලෝ පුබුදන්නේ)//

අම්බිලි මාමේ ඔබ ...
x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

MadhuraGeet

Touch through music

## 103 - අවදිවන්න අවදිවන්න - සී. ටී. ප්‍රනාන්දු

(අවදි වන්න අවදි වන්න දීප්තිමත් දිනකි උදාවෙලා තියෙන්නේ
හිතනවාට වඩා සොඳුරු විනෝද බර ලෝකෙක අපි ජීවත් වෙන්නේ)//

(සුසුම් හෙලන කලට දුක්වෙලා ඔබත් සමග කවුද අඬන්නේ) //
ටිකක් සතුටු වන්න සැනසිලා දහසක් ඒ ලෙස හිනැහෙන්නේ

අවදි වන්න අවදි වන්න .../

(බලනු මැනවි කුරුලු කැදැල්ලේ සතුට සැපත රස ඉතිරෙන්නේ) //
එහෙම ඉඳිමු සිත සැනසිල්ලේ දුකිනි මිනිස් කම ලැබගන්නේ

අවදි වන්න අවදි වන්න .../

(දුක සැප දෙක පෙරලි පෙරලි යයි යන කාලය නැත නවතින්නේ) //
ඊයෙ වගේ අද ටිකක් සුභයි අදට වඩා හෙට හොඳ වෙන්නේ

අවදි වන්න අවදි වන්න ...//

X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 104 - සීගිරි සුකුමාලියේ - සී. ටී. ප්‍රනාන්දු

සීගිරි සුකුමාලියේ හෙළ රජ සමයේ
මතකද අප පාවුනා පෙම් අම නදියේ
ලස්සන ඔබ රූපයේ නෙත සිත බැඳුනේ
නාමය ශ්‍රී ලංකාවේ රැව් දෙන්නේ
ඔබගෙ නේ සොඳුරේ ...

අතකින් මල් දරාලා හසරැලි පාලා
සුසිනිඳු සළු ඔතාලා විලවුන් ගාලා
ගෝමර පෙති විදාලා දිස්නය දීලා
ආදරයෙන් උන් කාලය මේ දැතේ
සිතුවම් වීලා ...

සීගිරි සුකුමාලියේ ...

ඔබ රුව නැත මැකීලා කල්ගත වීලා
මුළු දෙනෙතින් බලාලා සිත සැනසීලා
ජනකවියක් ගොතාලා කවි පද මාලා
කී විලසින් මම් ගයම් රන් වන් ගී
වත සපුරාලා ...

සීගිරි සුකුමාලියේ ...

X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

# 105 - සුවඳ රෝසමල් - සී. වී. ප්‍රනාන්දු

(සුවඳ රෝස මල් නෙලා මාල ගොතාලා
ගෙලේ දමා ඉනේ ඔතා සිරස සදාලා) //

ඇත ඩේලියා පිච්ච ඩේලියා
පලා නෙලා ගනිමි මෙමා උයනෙ සරාලා
(මාල ගොතාලා ... ගීත ගයාලා ...)//
තබා පතුල් රඟන රඟා බලමු සියල්ලා

මිහිරි ගීත ගය ගයා - පේලි සැදීලා
සිනා පපා වටේ යතා - නටති සිනා පා
බාලවූ ළමා - හිදිති මල් දමා
දෙපා පිදින් පදට තබා කිකිණි සලාලා ...
(දෑත නගාලා ... නේක විදාලා ...)//
නමා කමල් පදැති සුරල් රඟ පරදාලා
සුවඳ රෝස මල් නෙලා ...

X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

106 - රන්වන් රන් කෙඳි - සී. ටී. ප්‍රනාන්දු

(රන්වන් රන් කෙඳි පීරාලා - චන්දන කල්කෙන් නෑවීලා) //
කිංකිණි නූ පුර නාද දී - මල් මල් මුනක් සේ ඇදී
උකුල සලාලා බඳ නලවාලා රඟන්න සියුමැලියේ
(රන්වන් රන් කෙඳි පීරාලා - චන්දන කල්කෙන් නෑවීලා) //
කිංකිණි නූ පුර නාද දී - මල් මල් මුනක් සේ ඇදී
උකුල සලාලා බඳ නලවාලා රඟන්න සියුමැලියේ

(හද වීණාව ගී නාද දේ - නයනා නන්ද රූපේ අගේ) //
ප්‍රිය නාරිලතා කිම නැත්තේ කතා
රණ හන්සි වගේ හිටියේ ..
රමණීයයි ඔබේ නෙත් ප්‍රියේ ..
හෝ ..රන්වන් රන් කෙඳි .../

(නෙතගේ බැල්ම නිලුපුල් වගේ - මුතු සේ දන්ත කල්‍යාණ වේ) //
සුර ලෝකෙන් ගෙනා - සළු සුළඟේ වනා
රණ මයුරී ලෙසේ මල් ලොවේ
රඟ පානු සිනා පා මුවේ

හෝ ..රන්වන් රන් කෙඳි ...//

X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 107 - සඳවට රන්තරු - සී. ටී. ප්‍රනාන්දු

බඩගිනි වෙලා ගොඩවුනු කල පුතුගෙ ගෙට
මා යකිණියක ලෙස පෙනුනයි ලේලියට
දරු සෙනෙහසින් ඇඟ ලේ පෙරලුනි කිරට
අම්මද බිරින්දද ලොකු වැඩියෙන් නුඹට

සඳවට රන්තරු කැකුළු පිපේවා
හිරුට වලාකුළු සළු පැලදේවා
පොළවෙහි මිණි මුතු කැට බිහිවේවා
පුතෙකුට අම්මගේ අගය දැනේවා

ගඟුලට ඇති බර දිය රැල නේදෝ
කතරට ඇති හර සුදුවැලි නේදෝ
ළඳකට ඇති හැඩ යහගුණ නේදෝ
මවකට ඇති සැප දරු සැප නේදෝ

ගින්නක් නැති කල දුමක් කොහින්දෝ
පින්නක් නැති කල කෙතක් කොහින්දෝ
වහලක් නැති කල ගෙයක් කොහින්දෝ
අම්මෙක් නැති කල දයක් කොහින්දෝ

සඳවට රන්තරු ....
x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

108 - මිහිදුම් සළු තිර - සුනිල් එදිරිසිංහ සහ නීලා වික්‍රමසිංහ

(මිහිදුම් සළු තිර පැළැඳි නමුණු කුල
සෙවනැල්ලේ මුළු ලොවින් සැඟව ගමු
නිකෙලෙස් හද බැඳි විකසිත ආදර
තේමා ගීතය එක්ව ගයන්නට) //

වනගැබ වනපල නෙලා ගෙනෙන්නම්
වනමල් දහරින් මාල ගොතන්නම්
පෙම් රකුසන්ගෙන් ඔබ සුරකින්නම්
තුරු සෙවනැල්ලට මල් අතුරන්නම්

මිහිදුම් සළු තිර ...

ඕනෑ නැත අන් කිසිවක් මිහිමත
පාරාදීසය මෙහි පිරී ඇත
මානවිකාවනි හෙට හිරු කිරණට
ටිකිරි සිනාවක් මුසු කරවනු මැන

මිහිදුම් සළු තිර ...

x

## 109 - නිම් තෙරක් නොදුටු - සුනිල් එදිරිසිංහ

(නිම් තෙරක් නොදුටු මේ ලෝකයේ
රුදු සපුන් නිබඳ සරණා බිමේ) //
ඔබේ හිනාවත මගේ නවාතැන
අරුණු විහිදුවාවී - ජීවිතයේ

(රැල් නගා ගලන ගංගා දියේ
මං වසා දමනු හැකිදෝ කෙසේ) //
සොයා සයුරු දිය හඹා ඇවිත් ගඟ
සදා සැඟව යාවී - සාගරයේ

(සිල් බිඳී නුවන් කැළඹූ වනේ
බිම නොලා නෙළු පළ මාවතේ) //
සදා ඔබේ ගිම් බෙදා ගනිම් මම්
තැවුල් සැඟව යාවී - මාරුතයේ

නිම් තෙරක් නොදුටු .../

x

## 110 - පලංචියේ ලී ඉරුවේ - සුනිල් එදිරිසිංහ

පලංචියේ ලී ඉරුවේ අපි එකට
මල් පැන් පොදක් රහ බැලුවේ අපි එකට
එක වාඩියේ කල් ඇරියත් හිත හොඳට
ඇයි මස්සිනේ පෙම් කලෙ අපි එක මලට

විරසකවී රැපුන් ලෙස යුද වදින්නද
කුළුඳුල් පෙම මෙයයි ඉන් අත් මිදෙන්නද
පෙම්දම් නිසා මිතුදම් බිඳ දමන්නද
හොඳ හිත නුඹෙ තරම් ලොවකින් ලබන්නද

පලංචියේ ලී ඉරුවේ ...

දොඩමළු කතා නෑ අද වාඩිය හෙවනේ
නිදි නැති රැය පුරා නුඹෙ සුසුමයි ඇසුනේ
හොර රහසින්ම එක සුවඳක් පැතු සඳිනේ
නුඹවත් නැතිවේද හෙට මට සකි සඳුනේ

පලංචියේ ලී ඉරුවේ ...

x

(තිරය ඇරෙනවා තිරය වැහෙනවා
ඔල්වරසන් හඬ පැතිරෙනවා
සඳළු තලෙන් බැස මානවිකාවන්
තාලෙට ඉඟ සුග නටවනවා)//

කලගෙඩි නැටුමට කලගෙඩි සොලවති
නල වතුරෙන් සැනැහෙන දරුවෝ
ගොයම් නැටුමකට දෑකැති ලෙලවති
කුඹුරක් ඇස නොගැටුන දරුවෝ

තිරය ඇරෙනවා ...

දෙපා සැලෙන මුත් බෙර කවි තාලෙට
කරලිය හිමි නැති අපේ ළමයි
හේනට කුඹුරට ගතසවි දියකර
කරලිය අබියස බලා හිඳියි

තිරය ඇරෙනවා ...

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

112 - අන්න බලන් ඉදිකඩ ලඟ - දීපිකා ප්‍රියදර්ශනී

(අන්න බලන් ඉදිකඩ ලඟ
කොක්කු රෑන වගේ ඇවිත්
පුංචි එවුන් නුඹ එනකන් පාර බලන්නේ
හීන්සැරේ ගිහින් උන්ට එකතු වෙයන්නේ) //

පුංචි දූවේ නුඹ යනකොට
සුදු පාටින් ඉස්කෝලෙට
පුංචි මගේ අතීතයේ මං තනිවෙනවා
ලඳුබිම් මැද දෙවට දිගේ
දොළ පාරෙන් එගොඩ වෙලා
මගේ සිතින් මං ආයෙත් පාසැල් යනවා
අන්න බලන් ...

එක පුටුවක වාඩිවෙලා
එක පැන්සල දෙකට කඩන්
අකුරැ කෙරැව කාලය නෑ ආයෙත් එන්නේ
මං නොදුටුව නව ලෝකයෙ
කිරැළු පලන් රැජිණ වෙලා
පුංචි දූවේ නුඹ ඒ ලොව ගොඩ නගපන්නේ

අන්න බලන් ...

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

113 - නිම් හිම් සෙව්වා - අමරදේව

නිම් හිම් සෙව්වා මා සසරේ
හමුවී යුගයෙන් බැඳි යුගයේ
ළං වී වෙන් වී වරින් වරේ
ඔබ හා මා රන් හුයකින් බැඳුනේ

දිවියේ ආශා ගැඹුරින් ගැඹුරේ
ළයගින් සනහා අපමයි තැවුනේ
ජන්මෙන් ජන්මේ රැවුදීලා
ඔබ මා - නෙතගේ - රැඳුනා ...

නිම් හිම් සෙව්වා මා සසරේ ...

ඉර හඳ සේ මා පැතුමන් පැතුවා
සැනසුම් සයුරේ සුසුමන් හෙළුවා
අතරින් පතරේ වියැකීලා
සටනින් අද මා දිනුවා ...

නිම් හිම් සෙව්වා මා සසරේ ...

X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 114 - කුමරියක පා සළඹ - අමරදේව

කුමරියක පා සළඹ සැලුනා
වසා සිටි නෙතු පියන් ඇරුණා
කුමර බඹසර අසපුවේ මා
සමවැදී උන් දැහැන් බිඳුනා
කුමරියක පා සළඹ සැලුනා

උකුල ළැමහස මලවි කරලිය
මුවා කළ ඇගෙ දුහුල් සළුතිර
විවර කෙරුවා මනස් සළෙලුන්
උමතු වූ දෙනුවන් රැඟැන් ඇද
මා අභියස මැවෙණු තුසිතය
සුරන් නැලවූ … සුයාමය
කුමරියක පා සළඹ සැලුනා

නිසල ජීවන තපෝවන මැද
හැඟුම් ගජසෙන් යදම් බිඳ වැද
තලා සිත කම්පනය කරවයි
ලපළු තුරුවැල් කැකුළු මල්පෙති
මා හඬවයි බිඳුනු තුසිතය
සුරන් නැලවූ … සුයාමය
කුමරියක පා සළඹ සැලුනා

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

115 - විකසිත පෙම් - අමරදේව

විකසිත පෙම් පොකුරු පියුම්
ඔබේ පයට පොඩිවී ගියාදෙන්
පති කුලයට අද මට පිටුපා යන
(මගේ සොඳුරු ළඳුනේ) //

හිතේ කඳුළු බිඳු රෑ තනි යහනේ
ඉහ ඉද්දර හිඳ ඉකි බිඳිනා සඳ
ආදර සැමරුම් ප්‍රේම පුරාණේ
(ඔබට විරහ ගිනි නොගෙනේවා) //

විකසිත පෙම් පොකුරු පියුම් ...

තනිකම රජයන පාළු විමානේ
ගොම්මන් කළුවර හඬා වැටෙද්දී
ඔබ දිවි අරණේ රුවන් විපිතයේ
(මැණික් පහන් වැට දැල්වේවා) //

විකසිත පෙම් පොකුරු පියුම් ...

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

116 - හෙළ ජාතික අභිමානේ - සී. ටී. ප්‍රනාන්දු

(හෙළ ජාතික අභිමානේ වැඩු විරුවන් සේ පොරණේ
දිනු මවු බිම සව් සිරියෙන් සරසව්
පිබිදෙව් පිබිදෙව් සැරසෙව්) //

වීර විකුම් පෑ පෙර දරුවෝ - දෙස රැස මුර කෙරුවෝ
ඒ ලෙය ඇති ඔබ සුර විරුවෝ
නොමවවු ණය කරුවෝ
දැය දියුණට පැද යන නැවියා - ගොවියා බිම දෙවියා
(විපතෙහි සැපතෙහි නොසැලෙයි නොතැලෙයි
අට ලෝ දම හුරු හෙළයා) //

හෙළ ජාතික අභිමානේ ...

මුදට ඇදෙන මහ ගංගා - කුඹුරට යලි හරවා
ධාන්‍ය වගා කොට සිරිලක මේ - පෙර දිග කෙත කරවා
අරපිරිමැස්මට පුරුදු වෙලා - බිඳලව් දුක සංකා
(පැරකුම් යුගයක් නැවතත් අරඹව්
නිජ භූමි තලේ ලංකා) //

හෙළ ජාතික අභිමානේ ...

x

117 - අනේ ඕංගක් ඉන්නකෝ - සී. ටී. ප්‍රනාන්දු

(අනේ ඕංගක් ඉන්නකෝ ඔය
දෑත පොඩ්ඩක් දෙන්නකෝ
ඇයිද කලබල අහක බලබල
යන්නෙ ඕංගක් ඉන්නකෝ) //

(පුංචි මාමගෙ කුඹුරේදී පැලක් ඉන්දන දවසේදී)//
(දනක් මඩේ එරි එරී එදා පැල සිටවූ සැටී) //
තාම මතකයි ඊයෙ වගෙමයි
දෙතොල් අව්වේ සැලි සැලී
අනේ ඕංගක් ඉන්නකෝ ...

(කුඹුක් ගහ යට බට කැලේ නාන විටදී ඔබ දොලේ) //
(හිසත් ජලයේ ගිලි ගිලී දෙඅත් දියබුං කෙලි කෙලී) //
දෑත නලවා සිනහ සැලුවා
ළපටි මුහුණේ මල් පිපී
අනේ ඕංගක් ඉන්නකෝ ...

x

118 - පියුමෙහි පැණි බොති - සී. ටී. ප්‍රනාන්දු

(පියුමෙහි පැණි බොති වන බඹරු
මල මත නොරැඳෙති කළු දෙබරු
දහවල් නොදිලෙයි අඹරේ තරු
අවරින් නොනැගෙයි නැගෙන හිරු) //

(කුසගිණි හැදුනට ඉඳුල් නොකවි
තණකොල නොබුදුති සිංහ පැටවි) //
(හොඳ මල් නොපිපෙයි ගිරි මුදුනේ
ගව තෙල් නොදමයි රන් බඳුනේ) //

පියුමෙහි පැණි බොති ...

(ගැයුවට ඉම්හිරි පද උපුටා
කොවුලෙකු වෙනවද කළු කපුටා) //
(සුදු පැහැ හැරියේ කවුද කිරේ
මුතු නොබඳියි ගිරවියගෙ කරේ) //

පියුමෙහි පැණි බොති ...//

X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

119 - පුන් සඳ හිනැහෙන්නේ - සී. ටී. ප්‍රනාන්දු සහ රුක්මණී

පුන් සඳ හිනැහෙන්නේ - වන මල් පිබිදෙන්නේ
ලස්සන ඔබෙ මුහුනේ - දැක්කම නොවැ මැණිකේ
කොයිබද ඔබ යන්නේ - මේ උදයම අපෙ ලන්දේ
මගෙ පැල්පත පැත්තේ - ඔබ සම්පත ගෙන එන්නේ

වසන්ත සමයේදි ඔබ ලඟ ඉඳගෙන මිහිරට කවි කියමී
සමන් කැකුළු මල් පොකුරක් අරගෙන ඔබේ හිසේ ගසමී
ඔබ නිදියන තුරු පැල තුල ඉඳගෙන නැලවිලි ගී ගයමී
උදය සවස මම ඔබෙ පායුග හිමියනි සැමදා වඳිමී

පුන් සඳ හිනැහෙන්නේ ....

නිල්දිය බැස යන ගංගාවේ මම ඔබ හා ඔරු පදිමී
සඳ ඇති කාලෙට ඔබෙ සුදු අත ගෙන ගං තෙර වෙත දුවමී
පළතුරු යුෂ ගෙන මී පැණි දවටා රසකර එය පොවමී
කුඹුරට යන්නට පෙර බත ඇඹුලද සාදා ඔබට දෙමී

පුන් සඳ හිනැහෙන්නේ ...වනමල් පිබිදෙන්නේ ...
නිල්දිය බැස යන්නේ ... ආසිරි පුද දෙන්නේ ...
මොණරුන් රඟදෙන්නේ ... පොඩි කුරුලන් නද දෙන්නේ ...
ඔබ දෙස බලමින්නේ ... උන් සැම දෙන සැනසෙන්නේ...
X

## 120 - කුමටද සොබනියෙ - නරි බෑනා

කුමටද සොබනියෙ කඳුළු සලන්නේ හේතුව මම නොදනිම්
ගිරි හෙල් අරඹේ ඇති මගෙ නිවසට මම ඔබ ගෙනයන්නම්
(ඔබහට හැම සැප එහි දෙන්නම්)//
කුමටද සොබනියෙ කඳුළු සලන්නේ හේතුව මම නොදනිම්
ගිරි හෙල් අරඹේ ඇති මගෙ නිවසට මම ඔබ ගෙනයන්නම්
කුමටද සොබනියෙ කඳුළු සලන්නේ

සඳ පායන කල ගඟබඩ ඉඳගෙන (ඔබෙ හිස පීරන්නම්)//
මල් පෙති විසිරුණු සුදුවැලි මතුපිට (ඔබ ගෙන ඇවිදින්නම්)//
(සොඳුරියෙ ආදර බස් දෙන්නම්)//
කුමටද සොබනියෙ කඳුළු සලන්නේ හේතුව මම නොදනිම්
ගිරි හෙල් අරඹේ ඇති මගෙ නිවසට මම ඔබ ගෙනයන්නම්
කුමටද සොබනියෙ කඳුළු සලන්නේ

තණ අග දිලිසෙන පිණිකැට අරගෙන (ඔබෙ ඇඟ දෝවන්නම්)//
ඉර පායන විට පුබුදුණු මල් ගෙන (ඔබෙ හිස සරසන්නම්)//
(කුමරියෙ ආදර බස් දෙන්නම්)//
කුමටද සොබනියෙ කඳුළු සලන්නේ හේතුව මම නොදනිම්
ගිරි හෙල් අරඹේ ඇති මගෙ නිවසට මම ඔබ ගෙනයන්නම්
(ඔබහට හැම සැප එහි දෙන්නම්)//
කුමටද සොබනියෙ කඳුළු සලන්නේ
x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 121 - සුරතලියේ සුකොමලියේ - මොහිදීන් බෙග්

(සුරතලියේ සුකොමලියේ සුන්දර රාජිණියේ
විවාහයේ මල් නෙලා පලඳිමුකෝ) //

(මා සුදා මගෙ සුදා පෙම් ලොවේ රාජයා) //
(මා ඔබේ - ඔබ මගේ) //
මා ඔබේ ඔබ මගේ විවාහයේ මල් පළඳිමුකෝ

වන රැජිණී මාල ගොතා පිළිගැනුමට ආවා
සුරංගනාවිය සොයා ප්‍රේම ලොවේ

(ආලයේ ගී ගයා සෝ ගඟ පසු කරදා) //
(සැනසෙමු - නැලවෙමු) //
සැනසෙමු - නැලවෙමු සඳයි ලපේ වගෙ වෙන් නොම වී

මඩ වගුරේ පිපුණු මලේ
අඩු නොමවේ සුවඳේ අපේ විවාහය නිසා ස්ථිරවේ

සුරතලියේ ....

x

## 122 - සිහින ගෙනෙන - ක්ලැරන්ස් විජේවර්ධන

සිහින ගෙනෙන ඔබ කවුරුන්දෝ
අලුත් සිහිනයක් මට නැතිදෝ
සුපුරුදු එක සිහිනෙම දැකලා
සිතේ සතුට මගෙ ඇත මැකිලා

ගත වෙහෙසා මම යහනට ආවිට
දෙනෙත් වැසී යයි නොදැනී මා හට
සිසිලක් දැනේ මට ඒ මොහොතේ
සුපුරුදු සිහිනය පෙනෙයි සිතේ

සිහින ගෙනෙන ...

පැහැදිලි නැති එක රුවක් ඇතේ
සිහිනෙන් දැකුමට පැතුම් සිතේ
සිහිනෙන් ඒ රුව දැක ගන්න ...
මටත් වරක් අවසර දෙන්න

සිහින ගෙනෙන ...

x

MadhuraGeet

Touch through music

## 123 - සඳක් බැස ගියා - ක්ලැරන්ස් විජේවර්ධන

සඳක් බැස ගියා අවර ගිරේ ඉරක් උදා කරලා
මටත් ලොවක් තිබුණා මතකයි මම ඉම් සිහිකරලා
දෙළුම් මල් පිපුණු දෙවැට දිගේ පාසැල් ගිය කාලේ
මල් වගේ සිනාසුනු කෙල්ලන් හා මතකයි මගෙ බාලේ

විවේකයක් ලද විට්දි අපි දූව පැන ඇවිදිනවා
ගණන් තමයි මගෙ සිතට වදේ නිතරම වරදිනවා
ගමේ පාසැලේ වැඩට අපි පෙරමුණ ගෙන යනවා
තවත් වරක් ... තවත් වරක් මට පාසැල් යන්නට
ලැබුනොත් මම යනවා
දෙළුම් මල් පිපුණු දෙවැට දිගේ පාසැල් ගිය කාලේ
මල් වගේ සිනාසුනු කෙල්ලන් හා මතකයි මගෙ බාලේ

නිමක් කොනක් නැති අහස වගේ කෙලිලොල් දිවිය මගේ
මලක් පිපී සුවඳින් පිරුනා සේ මුහුණේ සිනහ රැඳේ
දුකක් සිතේ දැනුනේ නෑ මාහට අද මට දැනෙනු වගේ
තවත් වරක් ... තවත් වරක් මට පාසැල් යන්නට
ඇත්නම් හරිම අගේ
දෙළුම් මල් පිපුණු දෙවැට දිගේ පාසැල් ගිය කාලේ
(මල් වගේ සිනාසුනු කෙල්ලන් හා මතකයි මගෙ බාලේ)//
පොඩි කාලේ ......
x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 124 - සිහින ලොවක් - ක්ලැරන්ස් විජේවර්ධන

(සිහින ලොවක් දුටුවා මතකයි
සිහින ලොවින් ආවා මතකයි) //

සොඳුරු මිහිරි සුව පහස ගෙනෙන මේ
ආදර බර උනුසුම මතකයි
ඉර සඳ තරු කැට පායන මිහිපිට
ආදරයෙන් බැඳුනා මතකයි

සිහින ලොවක් .../

අප හදවත් එහි නොමියෙන ලෙස බැඳි
ආදරයෙන් පිරුනා මතකයි
සිතට දැනෙන සුව ගතට දැනෙන බව
ඔබ රහසේ කීවා මතකයි

සිහින ලොවක් ...//

x

## 125 - මලට බඹරෙකු සේ - ක්ලැරන්ස් විජේවර්ධන

මලට බඹරෙකු සේ සිතට ඔබ එනවා
කිරණ සේ හිරුගේ හද සිනාසෙනවා
ඔබ සිනාසෙනවා ...

දුකින් සිත මැලවී සිටින මොහොතකදී
ඔබ ගැනයි සිතුවේ නිවෙයි දුක පහවී
මලට බඹරෙකු සේ ...

ලොව පහන් වෙනවා රැය කරා යනවා
දහස් වර අතරේ ඔබව සිහිවෙනවා
මලට බඹරෙකු සේ ...

X

126 - කිරි මුහුද කලඹාලා - ක්ලැරන්ස් විජේවර්ධන

කිරි මුහුද කලඹාලා ගෙනා මගේ කුඩා පුතුටයි
මුතු මාලිගාවෙන් මා ගෙනා පැතුම් මගේ පුතුටයි
කිරි මුහුද කලඹාලා ගෙනා මගේ කුඩා පුතුටයි
මුතු මාලිගාවෙන් මා ගෙනා පැතුම් මගේ පුතුටයි

ගීතයයි මලයි සිහින ලෝකයයි
රන් තරුයි සඳයි පුතේ ඔබේ තමයි
සීනෙකින් ඔබේ දෙතොල් සැලෙයි ඉබේ
තරුමෙන් රුවන් ගැබේ දිලෙයි දෙනෙත් ඔබේ

කිරි මුහුද කලඹාලා ගෙනා මගේ කුඩා පුතුටයි
මුතු මාලිගාවෙන් මා ගෙනා පැතුම් මගේ පුතුටයි

තාත්තගේ සිතේ පැතුම් පිරී ඇතේ
අම්මගේ සිතේ සෙනෙහෙ පිරී ඇතේ
ඔබේ කුඩා නෙතේ කැළුම් බැලුම් පුතේ
සදා අපේ හිතේ රැඳී තිබෙයි පුතේ

කිරි මුහුද කලඹාලා ගෙනා මගේ කුඩා පුතුටයි
මුතු මාලිගාවෙන් මා ගෙනා පැතුම් මගේ පුතුටයි

X

127 - සුරඟන වෙස් වලා - ක්ලැරන්ස් විජේවර්ධන

(සුරඟන වෙස් වලා - සලා උකුළු තලා
රඟන ලියන් බලා - නෙත් බිඟු මත් වෙලා) //

(තිසර පටින් ලැමා කියන රහස කිමා) //
(සැලෙන මෙවුල් දමා විසිතුරු නැත නිමා) //

සුරඟන වෙස් වලා - සලා උකුළු තලා
රඟන ලියන් බලා - නෙත් බිඟු මත් වෙලා

(ඉඳුදුණු බැම් නිලා දෙනයන ලංවෙලා) //
(රසයට මං බලා දන මන මත් කලා) //

(සුරඟන වෙස් වලා - සලා උකුළු තලා
රඟන ලියන් බලා - නෙත් බිඟු මත් වෙලා) //

x

128 - මාස්ටර් සර් - නීලා වික්‍රමසිංහ

පනම් අටෙන් .. මට වැඩිකර දුන්න
හැකි වුනත් බත් මිටක් දරුවට කවන්න
මාස්ටර් සර් මගෙ හිමිතැන දෙනවාදෝ
අනේ සර් අනුකම්පා නොසිතේදෝ

අප අතරේ කඹ ඇදිල්ලෙ තරගෙ මේ
නිම වෙන්නට කල් ගතවේදෝ
අනේ සර් අපි මිතුරන් වේ දෝ
එදා දවස උදා වේවිදෝ

මට මතක් වෙනව සුද්දා තැළු පෙළු හැටි
අපි කතා කලේ පණ ගැහි ගැහි දනින් වැටී
මාස්ටර් සර් මගෙ හිමිතැන මට දෙන්න
අනේ සර් කරුණාවෙන් සලකන්න

අප අතරේ කඹ ඇදිල්ලෙ තරගෙ මේ
නිම වෙන්නට කල් ගතවේදෝ
අනේ සර් අපි මිතුරන් වේ දෝ
(එදා දවස උදා වේවිදෝ) //

x

(දස්කොන් සකි සඳ ඉක්මන් ගමනින්
නොඑනා ගමනකි යන්නේ
එනමුත් ලඳුනේ මතු අත් භවයේ
ඔබ මා යලි හමුවන්නේ) //

සියොලඟ හිම් ලඟ හදවත මා ලඟ
කෙලෙසද හද බැඳලන්නේ
කවුදෝ රැකවල් ලන්නේ
ඔබ මා යලි හමුවන්නේ

දස්කොන් සකි සඳ ...

මිය යම් මනුලොව හමුවෙම් පෙම්ලොව
ලොව්තුරු සුව වලඳින්නේ
කිසිදා නැත සමුගන්නේ
ඔබ මා යලි හමුවන්නේ

දස්කොන් සකි සඳ ...

X

## 130 - සු සැට බරණින් - නීලා වික්‍රමසිංහ

(සුසැට බරණින් සැරසීලා
නා කපනා වැහි වැටෙන වෙලේ
විසාකා තොමෝ පැමිණි විලාසෙන්
මට එන්නට බැහැ නිසංසලේ) //

පමා වුනෝතින් මන්දාරම් යකු
පලාපු දර ටික තෙමා දමාවී
පමා වුනෝතින් රත්තියි පැටියයි
ඕවිට අයිනේ තෙමී නැහේවී

සුසැට බරණින් සැරසීලා .../

පමා වුනොත් දොල දෙගොඩ තලාලා
එදඬු මංකඩ අගුලු දමාවී
එහෙම වුනෝතින් උපුලියි චූටීයි
කඳුළු වතුර වී බලා ඉඳීවී

සුසැට බරණින් සැරසීලා ...//

X

131 - ලෝ අඩ නින්දේ - සී. ටී. ප්‍රනාන්දු

ලෝ අඩ නින්දේ මේ රෑ යාමේ
සඳරැස් වතුරේ කිමිදෙන්නේ
රන් තරු බැබලේ නිල් ආකාසේ ලස්සන මල් වාගේ

කිරල ගසේ ගෙඩි දිය මත වැටිලා
පහලට බැස යයි දිය රැල්ලේ
නාමල් පිපිලා නැලවෙති සුළඟේ සුවඳ හමා දසතේ
(සෝබන මේ නදියේ)// සඳරැස් වැතිරෙන්නේ

ලෝ අඩ නින්දේ ...

ඇල් කෙතකින් එන දැරියකගේ හඬ
දැන් දැන් මා හද නලවන්නේ
මහ රෑ හින්දයි ඇයගෙ රිදී හඬ දසතම පැතිරෙන්නේ
(කවුරුද ඇල් හේනේ)// ගී හඬ පතුරන්නේ

ලෝ අඩ නින්දේ ...

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

132 - මගෙ සුදු මාමේ - සී. ටී. ප්‍රනාන්දු

කලුවන් කලු රුවයි අප ගම මදින්නා
මන්ඩි නැතුව රා හැමටම බෙදන්නා
එන එන කැකුළු මල් නැරම තලන්නා
දෙවියෝ රැක දෙන්න අප ගම මදින්නා

(මගෙ සුදු මාමේ)// නෑ බෑ නොකියා (රා පොඩියක් දී මා සනසන්නේ)//
(ගහෙන් ගහට අතුර දිගේ නගින්නා
ළපටි කැකුළු මල් බල බල තලන්නා)//
මන්ඩි නැතුව රා හැමටම බෙදන්නා අනේ වාසනාවන් මේ මදින්නා
(මගෙ සුදු මාමේ)// නෑ බෑ නොකියා (රා පොඩියක් දී මා සනසන්නේ)//

(ළපටි රා තරුණ අයටයි බෙදන්නේ
පැහුනු රා මහළු අයටයි ඔබින්නේ)//
විනාකිරට ඉතුරු කොටස තබන්නේ අවුරුදු අච්චාරුව ඉන් සදන්නේ
(මගෙ සුදු මාමේ)// නෑ බෑ නොකියා (රා පොඩියක් දී මා සනසන්නේ)//

(කිතුල් මල් කපා තෙලිදිය බාන්නා
රුහුණේ මී කිරට පැණි නිපදවන්නා)//
රසැති කිතුල් පොල් හකුරුද සදන්නා
ගමට කප් රුකක් මේ රා මදින්නා
(මගෙ සුදු මාමේ)// නෑ බෑ නොකියා (රා පොඩියක් දී මා සනසන්නේ)//
x

## 133 - මිරිවැඩි සඟලක් - නන්දා මාලිනී

මිරිවැඩි සඟලක් ඉල්ලා හැඬුවෙමි
පායුග නැති ඔබ දකින තුරා
කුංකුම අංජන ඉල්ලා හැඬුවෙමි
නෙත් යුග නැති ඔබ දකින තුරා

මාවත කටු අතු බොරළු මතක නැත
දෙපා රැඳුනු විට බුමුතුරැණෝ
දොරකඩ යදියන් ඉඳුල් යදින සඳ
මැඳුරේ දෙසවන් අගුලු වැටේ

සඳ කිඳුරන් ඇත සඳළු තලාවේ
රස මසවුළු වල සුවඳ පිරේ
ඒ රස සුවඳට දෑස අයාගෙන
බත් ඇට ඇහිඳිති පොඩි දරුවෝ

මිරිවැඩි සඟලක් ඉල්ලා හැඬුවෙමි
පායුග නැති ඔබ දකින තුරා
කුංකුම අංජන ඉල්ලා හැඬුවෙමි
නෙත් යුග නැති ඔබ දකින තුරා

X

# 134 - සකුරා මල් පිපිලා - නන්දා මාලිනී

සකුරා මල් පිපිලා හරි පුදුමයි
ගේ දොරකඩ නිල් වන පියසේ
නිදිමත නැතිවී හිරු පායා ඇත
උමතු වෙසින් මහ රෑ යාමේ

මින් රළ වෙරලේ සක්මන් කල සඳ
පා සටහන් ඇත වැලි තලයේ
නාග පිඹුරු රුදු සිංහ වලස් කැල
ඉගිලෙති නටමින් උඩු ගුවනේ
සකුරා මල් පිපිලා ...

යන එන සෙල්ලම් රිය පෙළ අතරින්
පාසැල් යනවිට බෝනික්කෝ
අකුරු උගන්වති කුඹි සිසුන් හට
වයසක ගුරුවරු සුටික්කෝ
සකුරා මල් පිපිලා ...

සුදම් සභාවේ අරගලයක් වී අහසින් කොටසක් වැටේ //
වියපත් සඳවත ගේ දොර නැතිවී හැරමිටි සරණින් බලාසිටී

සකුරා මල් පිපිලා ...

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

135 - පොඩි කුමාරිහාමියේ - වික්ටර් රත්නායක

පොඩි කුමාරිහාමියේ එපා වලව්වට යන්න නියර පිට
බලා ඉන්න පොඩි කුමාරිහාමියේ
කාසි එපා නුඹ හිනාවෙවී ඔහෙ බලා ඉන්නවා නම්

නිලමෙත් නපුරැයි ලමාතැනිත් නපුරැයි
නපුරැ වලව්වක කොහොමද කෝමල කතා නුඹට ලැබුනේ
වක්කඩ කැඩුවාසේ සිනාසෙන හිනා ගඟුල මැවුනේ
නුඹෙ හිනා ගඟුල මැවුනේ

පොඩි කුමාරිහාමියේ ...

කඩා ගන්න බැරි උනත් හරිම සුවඳයි
නෙරිය කොනේ මඩ තිතක් ඉහින්නට ආසයි නුඹට හොරා
මාල හතක් බැඳ පෝරුව මත හිඳ නොයන්න ගම හැරදා
නුඹ නොයන් මෙ ගම හැරදා

පොඩි කුමාරිහාමියේ ...

X

## 136 - නිල් මානෙල් - අමරදේව

නිල් මානෙල් මල් පිපුනා // - නෙත් සැදුනා ඒ අනුරාගී
නලල ඇගේ අඩසඳ වාගේ - මිහිරි නොවෙද හදවත කාගේ

මුතු ඇටවන් දත්පෙල සුදිලේ - සිනහ නැගේ දත්වල කැල්මේ
ඇයගෙ දෙපාලඟ මහද තැවේ - එපමණි මා ලද එකම සුවේ

දිගින් දිගට කාලය ගෙවුනා - මල් වැරුනා මංගල උයනේ
ලස්සන කෝ කොයි අතද ගියේ - තනිවිය මා තව ගෙවුනු රැයේ

සතුට සැපත නැතිවී නැතිවී - අඳුරු උනා මල්බර ජීවේ
තනිකම මා වට පැතිර සැදේ - වීණා තත් සත මිහිර බිදේ

පිසදාලා තනිකම ලෝකේ - ලොව නැගැවු සුගතිය ජලයේ
බුදුහිමි මම ඔබ හමුව ලොවේ - සටනට එන්නෙම් රැයද දිවේ

නිල් මානෙල් මල් පිපුනා ...

X

## 137 - ආදරයේ උණුසුම ළඟ - සෝමතිලක ජයමහ

(ආදරයේ උණුසුම ළඟ දුක දැනෙන්නෙ නෑ
දුක් කරදර නැති දවසට දුර පෙනෙන්නෙ නෑ
ජීවිතයේ හැමදාමත් සැප රැඳෙන්නෙ නෑ
සිනහ වෙවී සිනහ වෙවී කල් ගෙවන්න බෑ) //

තොල් මත මදහස නංවා ප්‍රාර්ථනා මල් පිබිදේ
ලෝකය උඩු යටිකුරු වී ප්‍රාර්ථනා වන් වැලලෙයි
සැමදා දුක සැමදා සැප නොමැති ලෝකයේ
සිනහ නැගේ කඳුළු නැගේ එයයි ජීවිතේ

ආදරයේ උණුසුම ළඟ ...

දිවා රැයේ දකින සිහින පවන් සලා ගිමන් නිවයි
සිහින ලොවම ගරා වැටී තැවුලින් හදවත් ඇවිලෙයි
ගීත හඬින් සුසුම් හඬින් පිරුණු ලෝකයේ
සිනහ නැගේ කඳුළු නැගේ එයයි ජීවිතේ

ආදරයේ උණුසුම ළඟ ...

x

## 138 - විල් තෙරේ පියුම් පිපී - සෝමතිලක ජයමහ

විල් තෙරේ පියුම් පිපී සුගන්ධ වත් වෙවී
ඇල් පවන් ගලා ප්‍රබෝධයෙන් ප්‍රමෝද වී
බිඟු නදින් විහඟ තුඩින් ගලා ගලා හැලී
(ගීතයක් වෙලා හෙටත් නැගෙන් උදෑසනේ)//

රන් කරල් නැමී සිරිබර වාසනා වෙනී
සත් රුවන් සිනා දොර තොරවු උදානෙනී
දෑතෙ වීරියෙන් දිනූ දා බිඳෙන් ඔපවුනු
අභිමානවත් දැයක් රැගෙන වරෙන් උදෑසනේ
විල් තෙරේ පියුම් ...

හිත් පිරී නිතින් යහගුනයෙන් උදාරවූ
ලොල් වඩන උපන් බිම වෙත වෙනි නිකාණ වූ
සෞම්‍යවන් පැතුම් තුලින් සුරන් බෙලෙන් වොරැඳුනු
යලි ජෝතිමත් දැයක් රැගෙන වඩින් උදෑසනේ
විල් තෙරේ පියුම් ...

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 139 - නව දැලි හේනක - සෝමතිලක ජයමහ

(නව දැලි හේනක පැව වැදිරි රුව
ලෙස උවමින් දෙනුවන් රවටා
මා පෙම් කල ජනපද කල්‍යාණිට
හිමියනි මට කල නොහැක නිගා) //

(සුරඟන රූසිරු දුටිමි හැදින්නෙමි
සිත් ලෙස දෙනුවන් බඳුන් පුරා) //
මා හඳුනන මගෙ හද ගත් කලණිය
මට නුදුරුයි සුරඟනට වඩා

නව දැලි හේනක ... /

(මා සිත සුවපත් කරලනු නොහැකිය
සෝ ලතැවුල් දෙයි රැයද දිවා) //
නෙත දුටු සුරඟන රූසිරු කුමටද
හද දුටු ජනපද කලණ නිසා

නව දැලි හේනක ... /

x

140 - බිම්බරක් සෙනග - ගුණදාස කපුගේ

බිම්බරක් සෙනග ගැවසුන චන්ද්‍රසූර්යයා ඉපදුන
ස්වර්ණ භූමියේ මනරම් මාලිගාව කෝ
යුද්දෙකට ඇවිත් රුපුසෙන් සත් මුහුදු මතින් ගුවනින්
කම්බි වටකල ඒ මනරම් මාලිගාව දෝ - මාලිගාව දෝ

ට්‍රැක්ටරේ යකඩ ගජසෙන් කුංචනාදයෙන් ඇලලුනු
වෘක්ෂ දේවතාවන් බිම වැටී පණ ගසයි
මිනී මල් පිපුණ සීතල නිම්න දේශයේ ඇටකටු
හතර රියන් කඩ අභිම්ව විලාපය නගයි - විලාපය නගයි

බිම්බරක් සෙනග ...

කැලෑ මල් පිපී රතු තොල් වලින් කෑගසා ඉල්ලන
ජාතියේ නිධානයෙ රන් රුවන් කරඬු කොයි
වැකන්ද කඩා බිම් කටු කම්බියෙන් බෙදා
මේ රණබිමේ හිස ගසා දමනා කඬුව බිම දමව් - කඬුව බිම දමව්

බිම්බරක් සෙනග ...

X

## 141 - පිපී පිපී රේණු නටන - නාරද දිසාසේකර

(පිපී පිපී)// රේණු නටන වනේ මලක හැප්පිලා
(වරෙන් වරෙන්)// සුලං පොදක් අපේ ඇගේ ගෑවිලා
කාගෙත් කාගෙත් පින් පල දීලා - කාටත් කාටත් දෙයියෝ දීලා
පුංචි පගේ ඉල්ලමකුත් පෑදිලා x 2

අසව් අසව් කොයි කාටත් රස පණිවිඩයක් කියා
(රෑන ගිරව් කුඹුරු උඩින් මල් මල් ගමනක් ගියා)//
(මල් මල් ගමනක් ගියා)//
(පිපී පිපී)// රේණු නටන වනේ මලක හැප්පිලා
(වරෙන් වරෙන්)// සුලං පොදක් අපේ ඇගේ ගෑවිලා
දෙන දෙවියෝ ගෙට ගෙනවිත් දෙනවා
අපටත් දවසක හඳ පායනවා - එදා අපිත් මල් පැණියෙන් නානවා

(අපේ ගමේ මල් පිපිලා මී මැස්සන් එක්වෙලා)//
(වරක ගහේ මී බැඳලා පැණි වරකා මෝරලා)//
(පැණි වරකා මෝරලා)// පිපී පිපී ... කාගෙත් කාගෙත් ...

(කොහේ ගියත් වලාකුලක් නිල් අහසේ පාවෙලා)//
(හෙමින් හෙමින් ලැගුම් ගනී කඳු මුදුනක දැවටිලා)//
(කඳු මුදුනක දැවටිලා)// පිපී පිපී ... දෙන දෙවියෝ ...

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 142 - පින් සිදුවන්නේ - සී. ටී. ප්‍රනාන්දු

පින් සිදුවෙන්නේ අනේ බාල ලමුන්නේ
මගේ කුඩා නිවස කඩා බිම නොදමන්නේ

වනේ පුරා සොයා ගොසින් කෝටු කඩාලා
කුඩා කුඩා කැබලි තුඩින් මෙහි ගෙනැවිල්ලා
ගසේ මුදුන් අත්ත උඩින් කෝටු තබාලා
උදේ පටන් දවස පුරා කූඩු තනාලා
පින් සිදුවෙන්නේ ...

කොලේ කොලේ දමා කුඩා නිවස සදන්නේ
මගේ දයා බිරිඳ නිතර එය සරසන්නේ
රැලේ රැලේ පුළුන් දමා යහන සදන්නේ
අගේ මටයි ළදරුවනේ එය නොකඩන්නේ
පින් සිදුවෙන්නේ ...

දෙමාපියන් සෙනේ වෙතේ තම දරුවන්ටා
ලමා ඔබෙන් අපට නැතේ මිහිපිට ඉන්ටා
සමාවෙලා මෙඅප වෙතේ දිවි රැක ගන්ටා
නමා යදිමි දෙන්න පුතේ මෙතැන රැඳෙන්ටා
පින් සිදුවෙන්නේ ... //
x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

143 - ගලන ගඟකි ජීවිතේ - නාරද දිසාසේකර - නන්දා මාලිනී

(ගලන ගඟකි ජීවිතේ දයාලු ලෝකයේ)//
මිහිර පතා ආදරේ -
මිහිර පතා ආදරේ ලපලු නටයි ගං තෙරේ
ගලන ගඟකි ජීවිතේ දයාලු ලෝකයේ

වැලිතල කිති කවන නටන පෙම් රලවැල ඉවුරැ බඳන
මිහිතලයක සුවය දැනෙන උකුළ තලය බඳු නැලැවෙන
ගලන ගඟකි ජීවිතේ දයාලු ලෝකයේ
මිහිර පතා ආදරේ ලපලු නටයි ගං තෙරේ
ගලන ගඟකි ජීවිතේ දයාලු ලෝකයේ

(පෙමට පෙම පුදා තුඩට තුඩු දිදී)//
කුරුළු ගී නගයි -
කුරුළු ගී නගයි ආදරේ - බැඳීලා

ගලන ගඟකි ජීවිතේ දයාලු ලෝකයේ

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 144 - ඕලු නෙළුම් නෙරිය රඟාලා - සිසිර සේනාරත්න

(ඕලු නෙළුම් නෙරිය රඟාලා කිකිණි හඬන වලා නඟාලා)//
ගගුල් තොටිල්ලේ මල් ඇතිරිල්ලේ
මගේ කුඩා ඔරුව හබල් ගා

යමු නැලවිල්ලේ නැලවිල්ලේ නැලවිල්ලේ
(ඇදී ඇදී යන්න නදී රිදී තොටිල්ලේ) //

(කිරළ කිරළි කුඩුවේ ලගී කුරුළු පන්ති නාද දී නගී) //
නැඹුරු වී බලා කුඩා සුදු වලා
ඔබේ රුවට වශී වෙලානේ
යමු නැලවිල්ලේ නැලවිල්ලේ නැලවිල්ලේ
(ඇදී ඇදී යන්න නදී රිදී තොටිල්ලේ) //

(කබරගොයා උගේ සුරතලී සොයා ඇදේ නගා දිය සුලි)//
කොකුන් කිරි වගේ නැගේ වෙල දිගේ
ඔබත් කොකුන් රැලක හැඩයි නේ
යමු නැලවිල්ලේ නැලවිල්ලේ නැලවිල්ලේ
(ඇදී ඇදී යන්න නදී රිදී තොටිල්ලේ) //

X

145 - [ශාන්ත මේ රෑ යාමේ] - අමරදේව

(ශාන්ත මේ රෑ යාමේ කුමුදු මලේ සිරියා
සඳ කාන්ති වැදී සෞමයා) //

(එයි නැගී හද ප්‍රේම තරංගා)// (මේ අමා දහරේ)//
නෙක තුරුලිය නැලවෙන්නේ
මේ සීතල මඳපවනේ

ශාන්ත මේ රෑ යාමේ .../

(හා ඇසේ වන කෝකිල ගීතේ) //
ශෝක යාවී සිදීලා වෙසඟ මේ පුන් පෝදා
මා හිමි දිනු ත්‍රෙලෝනා
ශාන්ත මේ රෑ යාමේ .../

(මේ රැයේ ගීත ගයාලා)// සුන්දර රඟපාලා
අති සෝබන මේ උයනේ
අපි නැලවෙමු පෙම් දහරේ

ශාන්ත මේ රෑ යාමේ ...//

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

146 - කිමද නාවේ - ඉන්ද්‍රාණි පෙරේරා

කිමද නාවේ ඇයි නාවේ තරහවී
කව්ද කීවේ බොරු කීවේ මගෙ දයා
පෙර නුයේ ඇයි වූයේ අද වගේ
කිමද නාවේ ඇයි නාවේ අද ඔයා

(හැමදාම බලා සිටියා මගෙ කවුළුව ළඟට වෙලා) //
කවදාවත් නැවුයේ මේ වාගේ
කිමද නාවේ ...

(මගෙ පැල්පත අද පාළුයි නිහඬයි අඳුරයි ඇත්තේ) //
කවදාවත් නැවුයේ මේ වාගේ
කිමද නාවේ ...

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 147 - හෝ ගා රැල්ල බිදේ - සුනිල් ශාන්ත

හෝ ..... හෝ ගා රැල්ල බිදේ //
මුදේ නාදේ... ඒ.....හෝ....හෝ ගා රැල්ල බිදේ

පැදලා පැදලා දෑත රිදෙනවෝ // වඩිදිය මා වෙහෙසන්නේ
රැල්ල කපාලා ඇදියන් ඔරුවේ // ගංගා මෝය දිහාවේ

ඒ.....(හෝ ..... හෝ ගා රැල්ල බිදේ) //
මුදේ නාදේ... ඒ....හෝ.....හෝ ගා රැල්ල බිදේ

සීතලේ මා වෙවුලමින් // තනිව මේ රෑ යාමේ
සීතලේ මා වෙවුලමින් තනිව මේ රෑ යාමේ
නිදි වරා වෙහෙසා සුසුම් ලා // මෝය බලා යන්නේ

ඒ ...(හෝ ..... හෝ ගා රැල්ල බිදේ) //
මුදේ නාදේ... ඒ....හෝ.....හෝ ගා රැල්ල බිදේ

ගී හඩින් - මා වෙලා - ගලා යයි හෝ හෝ ගා //
ජීවිතේ රස දැන් දැනෙන්නේ // මී අමා රස පෑහී

ඒ....(හෝ ..... හෝ ගා රැල්ල බිදේ) //
මුදේ නාදේ... ඒ....(හෝ.....හෝ ගා රැල්ල බිදේ) //

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 148 - කෝකිලයන්ගේ කෝකිල නාදේ - සුනිල් ශාන්ත

කෝකිලයන්ගේ කෝකිල නාදේ // හීන හඬින් හීන වගේ එයි නැගී

ජාති ජාති මලින් සුවඳ උරා බී - වටින් පිටින් සිසිල් සුලං හමන්නේ
සාමදාන සැඳෑ සුභා ඇදෙන්නේ - අන්න අන්න ඉරත් මුහුදෙ ගිලෙන්නේ
මගේ කුමාරී යාර තොටිල්ලේ පැදෙමු නිදැල්ලේ ...
කෝකිලයන්ගේ කෝකිල නාදේ // හීන හඬින් හීන වගේ එයි නැගී

සුදෝ සුදෝ අන්න සඳත් එබෙන්නේ - සාදු සාදු ඔබේ දෙසයි බලන්නේ
එපා එපා සදේ නිකං තැවෙන්නේ - ඇයිද මගේ සුදා මටයි ආදරේ
අන්න දෙව් ලියෝ අපේ පෙම් බලා ගීත ගයන්නෝ ...
කෝකිලයන්ගේ කෝකිල නාදේ // හීන හඬින් හීන වගේ එයි නැගී

සමන් මලක් නෙලා මගේ බිසෝගේ - හිසේ ගසම් අන්න මගේ විනෝදේ
එන්න අනේ එන්න මගේ කුමාරී - සාදු කියා හාදු දෙකක් දෙන්නෙමී
මගේ කිරිල්ලී හඬින් සුමිහිරී ගයා නමාවී ...
කෝකිලයන්ගේ කෝකිල නාදේ // හීන හඬින් හීන වගේ එයි නැගී

බොහොම ඇතත් සුදෝ මැණික් සාගරේ -ඔබයි මගේ මැණික මගේ ආදරේ
ඉතින් එපා සැකක් මගේ සුන්දරී මෙලෝ එලෝ ඔබයි මගේ පෙම්බරී
මගේ අසෝකා මගේ විසාකා මගේ මල්ලිකා ...
කෝකිලයන්ගේ කෝකිල නාදේ // හීන හඬින් හීන වගේ එයි නැගී //

X

## 149 - දිය ගොඩ සැමතැන - සුනිල් ශාන්ත

හඳපානේ ... හඳපානේ... හඳපානේ රෑ යාමේ
දියගොඩ සැමතැන කිරි ඉතිරේ ගස්වැල් කිරි මුහුදේ කිමිදේ
මඳ මුදු සුලඟින් අප නැලැවෙන්නේ බැබලෙන හඳපානේ
හඳපානේ ... හඳපානේ... හඳපානේ රෑ යාමේ

මගෙ පොඩි නංගී කිරි ඉල්ලා දෝත නගා මහ ඉහල බලා
අම්බිලියෝ කියමින් නැලැවෙන්නේ බැබලෙන හඳපානේ
හඳපානේ ... හඳපානේ... හඳපානේ රෑ යාමේ

දිය මතුපිට කිරි රැල්ල නැගේ ඔරුවක් තනිවී ඈත පෙනේ
හෝ ගා මුහුදේ රැල්ල බිඳෙන්නේ බැබලෙන හඳපානේ
හඳපානේ ... හඳපානේ... හඳපානේ රෑ යාමේ

වවුලන් ගේ බකමූහුණන් ගේ නාදය ඉඳහිට මටද ඇසේ
කිරි වෙනුවට ගොඹ සොයමින් යන්නා බැබලෙන හඳපානේ
හඳපානේ ... හඳපානේ... හඳපානේ රෑ යාමේ

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

150 - ඕලු පිපීලා - සුනිල් ශාන්ත

ඕලු පිපීලා විල ලෙලදෙනවා සුදට සුදේ නංගෝ
ඕලු නෙලාලා මාල ගොතාලා දෙන්නද සුදූ නංගෝ
එන්න දියේ බැස මා හා දෙන්න ඔබේ අත මාලා
ඕලු නෙලාලා මාල ගොතාලා පලඳිමු අපි මාලා

වැල නොකැඩී පෙම් කෙලිමින් යන්නෝ දණ්ඩි පැටවු නංගෝ
කුනිස්සෝ උඩ පැන පැන යන්නෝ අප කැඳවා නංගෝ
මෙන්න මලක් මා නෙලුවා කොණ්ඩෙ ඔබේ ඒ මාලා
ඕලු නෙලාලා මාල ගොතාලා පලඳිමු අපි මාලා

මා පරදිනවා ඔබගේ දෑතට මට ලජ්ජයි නංගෝ
හෙම්හිට හෙම්හිට නෙලමින් යමුකෝ කලබල ඇයි නංගෝ
ඕලු මලේ සුද නාලා ඔබ රුව වැඩි වෙයි මාලා
(ඕලු නෙලාලා මාල ගොතාලා පලඳිමු අපි මාලා )//

x

151 - සුවඳ රෝස මල් නෙලා - සුනිල් ශාන්ත

සුවඳ රෝස මල් නෙලා මාලයක් ගොතාලා
මගේ කොමල සොඳුරියේ බඳිම් ඔබ ගෙලේ

එන්න සුදෝ එන්න අනේ එන්න මා වෙතේ
මෙන්න මගේ සුරත ගන්න පෙම් දමින් වෙලා
පෙමෙහි මිහිර විඳ අපේ දිවිය ගෙවමුකෝ
එලොව මෙලොව සියළු සැපත පෙමමැ කරුණු වේ

සුවඳ රෝස මල් නෙලා මාලයක් ගොතාලා
මගේ කොමල සොඳුරියේ බඳිම් ඔබ ගෙලේ

ගිරා හඬක් කොහෝ හඬක් කෝකිල නාදේ
සමග රැගෙන මැවුනු රිදී හඬක් මෙන් අගේ
සොඳුර ඔබගෙ කටහඬේ ලලිත සුමිහිරි
එන්න අනේ මා නලවා ගන්න ප්‍රිය කතේ

සුවඳ රෝස මල් නෙලා මාලයක් ගොතාලා
මගේ කොමල සොඳුරියේ බඳිම් ඔබ ගෙලේ

X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

152 - ඔබේ නමින් සෑය බදිමි - අමරදේව

ඔබේ නමින් සෑය බදිමි විමානයෙන් බසිනු මැනවි
ස්වර්ණමාලියේ රෑබර ස්වර්ණමාලියේ
ඔබේ නමින් සෑය බදිමි විමානයෙන් බසිනු මැනවි

උනා නීල වර්ණ වරල දෑලේ මල් ගැවසි ලියේ
නගා ඉන්ද්‍රචාප දෙබැම ඇසින් විදුලි මවන ලියේ
වනා ළමැද කිණිහිරි පෙති රත්න තිලක පැළඳි ලියේ
සිනාසිසී විමානයෙන් බසින්න ස්වර්ණමාලියේ
ස්වර්ණමාලියේ රෑබර ස්වර්ණමාලියේ
ස්වර්ණමාලියේ

බාලචන්ද්‍ර පටු නළලත කල්ක අඳුන් අඳින ලියේ
ආල වඩන දන්ත කැකුළු කුණ්ඩ සමන් පිපෙන ලියේ
දෑල දෑත ස්වර්ණ දාම තාල හඬට වනන ලියේ
කෝල නොවී විමානයෙන් බසින්න ස්වර්ණමාලියේ
ස්වර්ණමාලියේ රෑබර ස්වර්ණමාලියේ
ස්වර්ණමාලියේ
ඔබේ නමින් ...

x

153 - මළ ඉරු බසිනා - අමරදේව

මළ ඉරු බසිනා සැන්දෑ යාමේ ඔබගෙන් සමු ගන්නම්
(අඳුරට ඉඩදී අඳුරේ සැඟවී)// ඔබගෙන් වෙන්වී මම යන්නම්

(නිදි නැති යහනේ රෑ යාමේ කාන්සියේ ඔබ හිඳිනා වේලේ)//
(සුලඟේ දැවටී ඔබට හොරෙන්)// ඔබ වෙත මම එන්නම්
සියුමැලි දෑතින් ඔබෙ හිස අතගා
සියුමැලි දෑතින් ඔබෙ හිස අතගා ඔබ නිදි කරවා මම යන්නම්

(අළුයම පිබිදෙන ඔබගේ දෑසේ
මල් පෙති අග පිණි කඳුලක් රඳවා)//
(සුසුමක් වාගේ ඉන් පිටවී)// ඔබගෙන් වෙන් වෙන්නම්
අඳුරට ඉඩදී අඳුරේ සැඟවී
අඳුරට ඉඩදී අඳුරේ සැඟවී ඔබගෙන් වෙන්වී මම යන්නම්
ඔබගෙන් වෙන්වී මම යන්නම්

x

## 154 - සොර දෙටුවෙක් - සුනිල් එදිරිසිංහ

සොර දෙටුවෙක් කස තැළුම් කකා
දන් ගෙඩියට ගෙන යන ගමනේ
වදක බෙරේ දැක සොරා ගන්ට එය
(කදිමයි ලොබ සිතුවාලු)//
අනේ මෙහෙම තන්හාවක්
අනේ මෙහෙම ආශාවක්
මිනිසුනි ලැබේද ඉන් සැනසීමක්

බුදු පුතෙකුන් පිඬු සිඟා වැඩියහොත්
දෙන්නට වේ යයි සැක හිතලා
මහ සිටුවෙක් - උඩු මහලේ සැඟවී
(පැණි කොමු පිස කෑවේලු)//

අනේ මෙහෙම තන්හාවක් ...

සුරා සොඬෙක් ගිරි කුලකින් විසිවී
මහපොලවට පාවී එද්දී
ගත දැවටෙන ඒ සීත පවන් රැලි
(අහෝ සැපයි කීවාලු)//

අනේ මෙහෙම තන්හාවක් ...

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

මේ ගුරු පාරේ මේ දොල අයිනේ
අපේ රහස් ඇත සැඟවීලා
අපේ රහස් ඇත ලියවීලා

(පටු මාවත් වල දූවිලි අතරේ
අපගේ ඉපැරණි පිය සටහන් ඇත)//
දොල මත දිදුලන පෙන පිඬු අතරේ
අපේ කථාවේ කෙටි පටුනක් ඇත
මේ ගුරු පාරේ ...

(ඉර හඳ ඇසුවා ඇල දොල දුටුවා
අතිනත ගෙන අප දෙඬු කතා බහ)//
එනමුදු එදවස් සඟවනු හැකිවෙයි
ඉරට හඳට ඇල දොලට කතා බැ

මේ ගුරු පාරේ මේ දොල අයිනේ
අපේ රහස් ඇත සැඟවීලා
අපේ රහස් ඇත ලියවීලා

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

156 - ඉපිද මැරේ - අමරදේව

ඉපිද මැරේ යළි ඉපිදේ
(නොතිර සසර සාගරේ)//
අතරතුරේ නොමැරි මැරේ
දස දහස්වරේ
නිසල නැතේ සසල වෙතේ
නොතිර සසර සාගරේ

(කුමන නැටුම් කෙලි කවට සිනාදා)//
මරුට නොමැත කිසිවිටක්දි බාදා
ඔබට නොදන්වා මරු මෙහි ආදා
යන්නට සිදුවන්නේ
ඉන්නට බැරි වෙන්නේ
නොතිර සසර සාගරේ
ඉපිද මැරේ ...

කුණුකය නිසරුයි - නැත පවතින්නේ
කල හොඳ පමණයි - මෙලොව රැඳෙන්නේ
නැති බැරිකම ලෙඩ දුක ඇතිවන්නේ
අපටයි මිනිසුනේ
ඇයි එය නොසිතන්නේ
නොතිර සසර සාගරේ
ඉපිද මැරේ ...
x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

157 - මින් දද හී සර - අමරදේව

(මින් දද හී සර වැදී සැලෙන හද
නංවන දුක් ගී ඔබට ඇසෙනවද
චන්දන මල් අතුරා ඇති යහනක
කන්ද කපා පායන් රන් පුන් සඳ)//

(තුරඟෙකු පිට නැගි නීල වලාකුළු
ගුවන් ගැබින් ඔබ ඇදෙන වෙලේ)//
(පිබිදුණු දෑසින් බලා හිදිමි මම)//
සුසුම් සිනා කැන් හද පුරවා
මින් දද හී සර ...

(මෙතුවක් කල්මුව මඬල වසා සිටි
අන්දකාර සළු පටින් මුදා)//
(නෙත්මිණි පහනින් පහන් කරනු මැන)//
අනාගතේ මන්පෙත පාදා
මින් දද හී සර ...

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

158 - ඇවිළුණු ගිනිදැල් - සනත් නන්දසිරි

ඇවිළුණු ගිනිදැල් නිවී නිවී යද්දී ඈ මට හමු වුවා
සුපිපුනු වන මල් සුවඳ හමද්දී ඈ මට හමු වුවා
ඇවිළුණු ගිනිදැල් නිවී නිවී යද්දී

(රන් කෙඳි දහරින් පෙරි පෙරි ඉතිරී)//
හිරු අවරට ඇදුනා
(පාළුව තනිකම රජයන විටදී)//
ඈ මට හමු වුවා
ඇවිළුණු ගිනිදැල් නිවී නිවී යද්දී ඈ මට හමු වුවා
ඇවිළුණු ගිනිදැල් නිවී නිවී යද්දී

(සුසිනිඳු සළුවක් සුලඟට ඇඹරී)//
රහසක් මට කීවා
(සුදු මුදු වැල්ලේ සිටියදි තනිවී)//
ඈ මට හමු වුවා
ඇවිළුණු ගිනිදැල් නිවී නිවී යද්දී ඈ මට හමු වුවා
සුපිපුනු වන මල් සුවඳ හමද්දී ඈ මට හමු වුවා

X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 159 - මා හද අසපුව - සනත් නන්දසිරි

මා හද අසපුව කුසුමින් සැරසුව
ඒ මල් බර දෑසයි
ජීවන මහමඟ කැල්මෙන් හෙලිකල
ඒ නිල්මිණි දෑසයි
දකින තුරු සිත දැඩි අවිවේකයි

(සෙනෙහස පොදි බැඳ සිතින් දරා
සැනසිලි පිණිදිය රැගෙන පෙරා)//
සැතපෙන කුටියට ඇය ආ අන්දම
සුවඳ සිහිනයකි භවය පුරා
මා හද අසපුව ...

(මුවින් අමඳ බිඳු බිඳු වෑහේ
සිතුම් පැතුම් එකිනෙක පෑහේ)//
දායාදය ලෙස අබැටක් නොපතමි
ඇගෙ නිකැලැල් හද මට සෑහේ
මා හද අසපුව ...

X

## 160 - මුදු පතුල යට ඉඳලා - මුදු පුත්තු

(මුදු පතුල යට ඉඳලා මුතු ඇටයක නිදි කරවා
පෙණ කැටියක පා කරලා මගෙ දෝතට පුතු ආවා
මගෙ දෝතට පුතු ආවා)//

(සුදු පාටින් තරුව දුර අහසේ දිලිසෙනවා)//
(සුදු පාටින් ටිකිරි සිනා පුතුගෙ මුවින් ගිලිහෙනවා)//

මුදු පතුල යට ඉඳලා .../

(වෙරලෙන් කිරි කවඩි සොයා කෙනෙක් පුතුට ගෙන එනවා)//
(තවත් කෙනෙක් පාට පාට පබළු කඩෙන් ගෙන එනවා)//

ඒ පබළුයි මේ කවඩියි එක නූලේ අමුණනවා
ඒවායින් හවඩි තනා පුතුගෙ ඉනේ පලඳනවා
(පුතුගෙ ඉනේ පලඳනවා) //

x

161 - චන්ද්‍ර මඬුළු යට - නන්දා මාලිනී

චන්ද්‍ර මඬුළු යට සුරංගනාවන් දූ සනහන්නට ගීත ගයනවා
දූවේ එපා ඒ කතා අහන්නට ඒ නැලවිලි ගී මමයි කියන්නේ

රන් තැටියට කිරි පැණි පුරවාගෙන හඳහාමි දූ බලන්න එනවලු
දූවේ එපා ඒ කතා අහන්නට හඳහාමි කෙලෙසද මෙහි එන්නේ

කිරි මුට්ටිය නුඹෙ ගගේ ගියාලු ගඟට උඩින් කිරි කොක්කු ගියාලු
දූවේ එපා ඒ කතා අහන්නටමමයි නුඹට ලේ කිරි කර දෙන්නේ

දූ අල්ලන්නට සැන්දෑ යාමේ මල්ලක් අරගෙන බිල්ලෙක් එනවලු
වීර දූවේ මා බිය නොමවන්නේ සිහල ලෙයයි නුඹ සූරැර දිවෙන්නේ

චන්ද්‍ර මඬුළු යට සුරංගනාවන් දූ සනහන්නට ගීත ගයනවා
දූවේ එපා ඒ කතා අහන්නට ඒ නැලවිලි ගී මමයි කියන්නේ

x

162 - පාවෙලා නිල් වලාවේ - අමරදේව

පාවෙලා නිල් වලාවේ

නදී තලාවේ රිදී ජලාසේ ඇගේ සිනාවේ
කැළුම් සැඟවුනාදෝ
පාවෙලා නිල් වලාවේ ....

දියඹ සැලෙන තරඟ පෙලක අතරමං වෙලා
පාළුනිල් දියේ තනිවෙලා
(සොයන රුව ඔබේ අප්සරාවියේ)//
පාවෙලා නිල් වලාවේ ...

තුරුණු සිතක පැතුම් වැලක ඈත පාවෙලා
සිහින නිම්නයේ සැරිසරා
(පතන රුව ඔබේ අප්සරාවියේ)//
පාවෙලා නිල් වලාවේ ...
නදී තලාවේ රිදී ජලාසේ ඇගේ සිනාවේ
කැළුම් සැඟවුනාදෝ
පාවෙලා ... නිල් වලාවේ ....

x

163 - චන්දන ඇඟ ගාලා - නාරද දිසාසේකර

පි: චන්දන ඇඟගාලා කොණ්ඩෙ කඩා දාලා
ගඟුලේ ගිලීලා ටිකිරිමලී නාලා වගේ
ගැ: වෙලේ පැලේදී හා පැල්කවි කියාලා පැල් රැකලා මහා රෑ
සිලිඳු උදේ ආවා වගේ
පි: චන්දන ඇඟගාලා කොණ්ඩෙ කඩා දාලා
ගඟුලේ ගිලීලා ටිකිරිමලී නාලා වගේ

ගැ: (වී කොටලා ඊයෙ හවස මං නාගත්තා අව්දි වී උදෙන්)//
පි: ගම්මුන් අපි වාගේ කම්මැලිවී බෑනේ
චන්දන ඇඟගාලා ...

ගැ: (සිහි නැති ගෑණියක් මා වගේ අනේ මතක නැති උනා වගේ)//
පි: මොටද හැරී යන්නේ කව්ද ඕක දන්නේ

පි: චන්දන ඇඟගාලා කොණ්ඩෙ කඩා දාලා
ගඟුලේ ගිලීලා ටිකිරිමලී නාලා වගේ
ගැ: වෙලේ පැලේදී හා පැල්කවි කියාලා පැල් රැකලා මහා රෑ
සිලිඳු උදේ ආවා වගේ
පි: චන්දන ඇඟගාලා කොණ්ඩෙ කඩා දාලා
ගඟුලේ ගිලීලා ටිකිරිමලී නාලා වගේ
x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

164 - කිරි පුස්සා - සෙක්කුව

පරසක්වල අපෙ මහ රජ්ජුරුවෝ තෑගි කලයි කිරි පුස්සා
සරුබිම හොයලා කම්මැලි වීලා පැන්නුවයි කිරි පුස්සා
නිදැල්ලෙ වැඩිලා දැන් හොඳ කඩසර කම්මැලි නැති කිරි පුස්සා
ආයෙත් සෙක්කුවෙ මේ සරුබිම හොයන්න බඳිනවදෝ කිරි පුස්සා
(රාලෙ බැඳපන් කිරි පුස්සා ... රාලෙ බැඳපන් අපෙ පැඟිරා ...)//

දෙමුහුන් කුලයේ උපන්න කදීම වුරුසබයෙකි අපෙ පැඟිරා
රටේම ඉපිදී හැදිලා වැඩුනයි රගේට මේ අපෙ පැඟිරා
සරුබිම හොයලා මුරන්ඩු වීලා කම්මැලි උනු අපෙ පැඟිරා
ආයෙත් සෙක්කුවෙ මේ සරුබිම හොයන්න බඳිනවදෝ අපෙ පැඟිරා
(රාලෙ බැඳපන් අපෙ පැඟිරා ...රාලෙ බැඳපන් කිරි පුස්සා ..)//

මෙච්චර කල් උඹ සෙක්කු මඟක සරුබිම් හෙව්වා නොවැ රාලේ
කරෙන් ඇදල ගොන් මාරු කරල උඹ හති වැටුනා නොවැ රාලේ
රාලේ, රාලේ -
මහතැන දොඩවන බේගල් අහලා තව රැදෙනුද මෙහි රාලේ
පැඟිරා පන්නල පුස්සව බැඳලා ගාටනවද අපෙ රාලේ

රාලෙ බැඳපන් අපෙ පැඟිරා ...රාලෙ බැඳපන් කිරි පුස්සා ..//
අපෙ පැඟිරා..කිරි පුස්සා..අපෙ පැඟිරා..කිරි පුස්සා..

X

කඩේට පලයන් චූං චෑං ඉක්මන් කරපන් චූං චෑං
අරක ගෙනෙන් චූං චෑං මේක ගෙනෙන් චූං චෑං
(කඩේ දූවනවා මං ... කෑම හොයනවා මං)//

(කෑමට රුසියෝ මේ සිංගප්පූරුවෙ වැසියෝ)//
(උස්මුරුතාවට කන්නට දූන්නොත් ඉස් ගෙඩියත් දං දෙනවෝ)

කඩේට පලයන් චූං චෑං ..

ගෙදර කෑම රස නැතියෝ රස කෑම හොයන් මෙහි එනවෝ)//
(සූකර තෙල් සූපයෙන් තනාලා චීන කෑම මං දෙනවෝ)//

කඩේට පලයන් චූං චෑං ..

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 166 - සුවඳ සබන් ඇඟ ගාලා - රවින්ද්‍ර යසස්

(සුවඳ සබන් ඇඟ ගාලා හායි හායි
කුඹුකෙ ලිදෙන් දිය ඇද නාලා
හැඩ වැඩ වෙන්න ඔයා ලස්සන සලු පලඳා
එනවා ඔබව සොයා)//

දීලා නෙතට අඳුන් මාලා පැලඳ කොකුම්
(නීලා නයන කැලුම් දීලා නෙතග බැලුම්)//
කැන්දන් යන්න තුටින්

සුවඳ සබන් ඇඟ ගාලා ...

පාලා අනඟ රැඟුම් රාජා සමඟ ඉතින්
(ඉන්නට ලැබෙන එකත් පෙරකල පිනකි උතුම්)//
තෝරා ගන්න ඉතින්

සුවඳ සබන් ඇඟ ගාලා ...

x

167 - සිරියාමෙ සාරා - එච්. ආර්. ජෝතිපාල

(සිරියාමෙ සාරා නැගෙව් හද මෝරා
මේ ප්‍රේමෙ අමදාරා ඕ ප්‍රේමෙ අමදාරා)//

ප්‍රේමේ නුරා ගීත රාවේ ඇසෙන්නා
(මේ පෙම් මල් පිපීලා මා හරදේ පිරෙන්නා)//
හෝ ....

ජිනරාජයා ඇත අහසෙ දිලෙන්නා
මේ ප්‍රේමෙ අමදාරා ඕ ප්‍රේමෙ අමදාරා

සිරියාමෙ සාරා...

(ගංගා පිරීලා ඉතිරී ගලන්නා ...)//
(ආලේ රසේ මා හදේහී නැගෙන්නා)//
හෝ ....

යාමි මෙදැන් පෙම් කුමාරි සොයාලා
මේ ප්‍රේමෙ අමදාරා ඕ ප්‍රේමෙ අමදාරා

සිරියාමෙ සාරා...//

X

## 168 - මංගෝ කලු නැන්දේ - ඇනස්ලි මාලේවන

(මංගෝ කලු නැන්දේ මොකදෑ මේ පැත්තේ
හැන්දෑ යාමෙ බලා ගෙදරින් පැනගත්තේ)//

බුලත් කොරටුවේ ලපටි දලු පැහේ
මංගොට තැන් හරිම වැඩ වගේ
පොලට ගෙනල්ලා ලාබෙට විකුනාලා
ගෙදර එන්නෙ හිනා වැහි වැහී

මංගෝ කලු නැන්දේ ...

මංගො නැන්දගේ දුව අංගො කුමාරී
ගිය සුමානෙ පැනල ගිහිල්ලා
ඇය අඬා වැලපිලා පොලවේ හැපී නැගිටලා
පලක් නෑනෙ දැන් පසුතැවිලා

මංගෝ කලු නැන්දේ ...

අහල පහල හැමෝම ඇගෙ කටට බය වෙලා
ඉන්නෙ ඇයට දිනුම පවරලා
මාමා ගෙදර ආව දාට ඇව හිරවෙලා
දහයට ගැන ගන්න බෑ වගේ
මංගෝ කලු නැන්දේ ...
X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

169 - රස ආහර කවලා - එම්. එස්. ප්‍රනාන්දු

රස ආහර කවලා රන් කුඩුවෙ දමලා ඇතිකරන්න ගත්ත මාල ගිරවී
අත හරින්න කියලා ඇයි කියන්නෙ ඔහෙලා
හිතුවද ඇය දාල යයි කියාලා

මම බත් කෑවද ගිරවි කියල ඇහුවම ඔව් මම බත් කෑව කියනවා
මම ගිරවි ගිහින් කැලේ අතාරින්නද අනේ අනේ එපා කියනවා
අපි ඇති කෙරුවත් රන් කුඩුවෙ දමලා කුස පිරෙන්න රස ආහර කවලා
ගිරවුන් යනවලු ලැබුනොත් පැනලා ඔබ යනවද මටත් එහෙම කරලා
වත්තෙ මල් පිපෙන්නෙ නෑ ගෙදර සිරියාවක් නෑ
ඔබ නැතිනම් මේ දේවල් නෑ
ඔය ගිරවුන් හොඳනෑ මේ ගිරවි එහෙම නෑ
අතහැරියත් දාල යන්නෙ නෑ
රස ආහර කවලා...

ඔබේ රෑන සමග පියඹාගෙන යන්න කුඹුරට ගොස් අහුලාගෙන කන්න
කැලේ ගහක රෑකාලෙ ගෙවන්න ඔබට ආස නැද්ද ඒ විදිහට ඉන්න
ලස්සන මල් වතුවල ගැවසෙන්න වලාකුළු ඉරාගෙන ඉගිලෙන්න
නෙලාගෙන ඇවිත් පලතුරු කන්න ඔබට ආස නැද්ද ඒ විදිහට ඉන්න
ඒ විදිහට ඉන්න ආසදැයි බලන්න මේ කුඩුවෙ දොර ඇරල තියන්න
මාව දාලා යන්න බැහැ නේද කියන්න මට ආසයි එය දැනගන්න
රස ආහර කවලා...
x

170 - අඬවන්වූ දෙනෙතින් - අමරදේව

(අඬවන්වූ දෙනෙතින් ගලනා මෙත් මුදිතා කරුණා ධාරා)//
(තෙමා තෙමා හද ගලා ගලා යන ලොව්තුරු ගුණ මහිමේ)//
මහ මෙව්නා උයනේ සමාධි බුදු පිළිමේ
අඬවන්වූ දෙනෙතින් ගලනා මෙත් මුදිතා කරුණා ධාරා

පිරී ඉතිරී යන මහ වතුරක් සේ
ගලා හැලෙන සිහිලැල් ගඟුලක් සේ
ගිමන් නිවාලන මේ භව කතරේ
නිවන් සදාලන බුදුගුණ මහිමේ
(මහ මෙව්නා උයනේ සමාධි බුදු පිළිමේ)//

අඬවන්වූ දෙනෙතින් ගලනා මෙත් මුදිතා කරුණා ධාරා
අඬවන්වූ දෙනෙතින් ගලනා මෙත් මුදිතා කරුණා ධාරා

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

171 - පරම රමණී - මොහිදීන් බෙග් සහ රුක්මණී

පරම රමණී අපේ ආලේ සදා කල් සැපත වී ලෝලේ
සමාජේ රුදුරු කාන්තාරේ කොහේ අපී යමුද නොම තේරේ
පරම රමණී ...
පරම රමණී අපේ ආලේ සදා කල් සැපත වී ලෝලේ
සමාජේ රුදුරු කාන්තාරේ කොහේ අපී යමුද නොම තේරේ
පරම රමණී ...

(කිමද වෙන්නේ අනේ නොදැනෙයි මෙයින් මතුදා)//
විදුලි හෙණ සැඩ සුලං නොමැතී
තැනක ඒ මල් ගසක් මුදුනේ තනා ගමු ප්‍රේම කුඩු අපි
පරම රමණී ...

(මේ ලෝකේ මාගේ දෙවි හන්දා ඔබයි මා ප්‍රේමයේ සුහදා)//
ඉටුවේදෝ මා සිතේ ආශා
දිලේ අර තාරකා කන්දා අපේ පෙම් මන්දිරේ සරසා

පරම රමණී අපේ ආලේ සදා කල් සැපත වී ලෝලේ
සමාජේ රුදුරු කාන්තාරේ කොහේ අපී යමුද නොම තේරේ
පරම රමණී ...

X

172 - මගෙ රත්තරන් හෙලේනා - රෝහණ බැද්දගේ

දැසමන් මලක් වගෙයි ප්‍රියංකරයි සුකෝමලයි
සුරංගනාවියක් වගෙයි අහිංසකයි රටක් වටියි
කව්ද ... (මගෙ රත්තරන් හෙලේනා)//

රාජ භෝජන නැත මට දෙන්නට සිහින් සිනිඳු සලු නැත මට දෙන්නට
ගේ දොර වතුපිටි නැත ගරු සරුවට යාන්තමට ඇත දිවි රැක ගන්නට
කව්ද ... (මගෙ රත්තරන් හෙලේනා)//

දැසමන් මලක් වගෙයි ප්‍රියංකරයි සුකෝමලයි
සුරංගනාවියක් වගෙයි අහිංසකයි රටක් වටියි
කව්ද ... (මගෙ රත්තරන් හෙලේනා)//

පසු කරමින් මහ කඳුවැටි ඕවිටි පාලු සොහොන් පිටි රබර් වතු බඩවැටි
ගල් මුල් වල පය පැටලී වැටි වැටි මතකයි හඳපානේ කැන්දන් ආ හැටි
කව්ද ... (මගෙ රත්තරන් හෙලේනා)//

දැසමන් මලක් වගෙයි ප්‍රියංකරයි සුකෝමලයි
සුරංගනාවියක් වගෙයි අහිංසකයි රටක් වටියි
කව්ද ... (මගෙ රත්තරන් හෙලේනා)//

x

173 - මහද නමැති වනබඹරා - එච්. ආර්. ජෝතිපාල

(මහද නමැති වන බඹරා ලංවී කනට ඔබේ
ආදරේ කියයි මෙසේ හ්ම්... හ්ම්....)//

මලින් මලට ඉගිලිලා රොන් උරන්නෙ නෑ මෙමා
ඉගිල එන්නෙ ඔයා ළඟට නේ ...
කටු අත්තක හැංගිලා අයින් වෙන්නෙ ඇයි ඔයා
රෝස මලට පමණි ආදරේ ...
රස මියුරු මේ සැන්දෑවේ
ආදරේ කියයි මෙසේ හ්ම්... හ්ම්....
මහද නමැති ....

සිඟිති ඔබට වෙහෙස දී හිරු නැගෙන්න පලමුවෙන්
ජීවන රස මිහිර විඳ ගමු ...
හෙටක් නොමැති අප ලොවේ අද පමණයි හමුවුනේ
ඉතින් කිමද තව ලතැවෙන්නේ ...
රස මියුරු මේ සැන්දෑවේ
ආදරේ කියයි මෙසේ හ්ම්... හ්ම්....
මහද නමැති ....//

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

174 - සීත සුනිල් දිය දහරා - එච්. ආර්. ජෝතිපාල

(සීත සුනිල් දිය දහරා ලා නිල් කඳු මනහාරා
තුරුලිය පිරිලා වනමල් පිපිලා සිත අලවයි ඇස නලවයි)//

තුන් සරණේ කවි කියලා ධර්මරාජ ගල නැගලා
ගෙත්තම්පානේ ගෙත්තම් කරලා මහගිරිදඹ පසු කරලා
යං යං යං හනිකට යං සුමන සමන්දෙව් පිහිට ලබන්
මුණි සිරිපාදේ බුදුරැස් විහිදේ සමන්තකූට රජාගේ
කමණීයයි රමණීයයි

සීත සුනිල් ...

නවජීවය දුන් මිහිරී - ප්‍රිය කෝමල ලාලන කුමරී
මාගේ ලෝකය වෙයි ආලෝකය බලනා කල ඔබ හිනැහී
රන් කඳ පෙම් - පෙර පිනකින්
ඔබ ලැබුනෙන් අද සැනසෙම් මම්
තිසරණ සරණින් දෙවි රැකවරනින් ජීවනයේ සැප සෑදේ
සිත සැනසෙයි පින පලදෙයි

සීත සුනිල් ...//

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

175 - කාගෙද ගොන්වස්සා - මූන්ස්ටෝන්ස්

මගෙ කුඹුරේ ඉණිවැට බිඳලා ලපටි ගොයම් පැල කා දමලා
රැක සිටියෙමි වෙහෙසක් නොබලා අල්ලා ගෙන ආවෙමි බැඳලා
කාගෙද ගොන්වස්සා මගෙ කුඹුරට බැස්සා
හොඳ ගානක් උස්සා පවරා දෙමි වස්සා

කාගෙද මේ හොර වසු පැටියා සොයා කෙනෙක් එනතුරු සිටියා
මගේ අලාබය මේ සැටියා අය කරගෙන දෙමි හොර කොටියා
කාගෙද ගොන්වස්සා ...

සවස් වෙලා අපෙ ගේ පැත්තේ කවුද බොලේ එනවා ඇත්තේ
වැටේ කඩුල්ලෙන් අර පැත්තේ අඳුනන මුහුණකි මම දැක්කේ
කාගෙද ගොන්වස්සා ...

මොකද ලදේ මේ අරුමැක්කේ කලකින් නුඹෙ ලස්සන දැක්කේ
අපගැන ඇයි සැලකුම් නැත්තේ මගෙනම් නැහැ වෙනසක් ඇත්තේ
කාගෙද ගොන්වස්සා ...

සිරිමල් අයියට පැණිවරකා ගෙන ආවෙමි ගෙදරින් පොරකා
සිරිමල් අයියේ මට සලකා දෙනවද මට මගෙ කලු හරකා
දුන්නට පැණිවරකා දෙන්නම් කලු හරකා
මා ගැන තව සලකා (දෙනවද බඟ මැණිකා)///
X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 176 - පිදුරු සෙවිකල - සිසිර සේනාරත්න

සීත දිය රැලි නීල ගංගා - සාර කෙත් වතු මැද ගලා යයි
ඕලු මානෙල් නෙලුම් නැලවෙන වැව් පොකුණු ගම අලංකාරයි

(පිදුරු සෙවි කල පැල්පතේ ඇති සාමෙ නැත මහ මන්දිරේ)//
ටිකිරි හසරැල් බොළඳ සිතිවිලි (මෙහි තිබේ හොඳ ආදරේ)//

කැලෑ මල් වල සුවඳ දීගෙන හමන මදනල වාසනාවන්
දුරින් ඉඳ එන කුරුළු ගී හඬ නැතිකරයි හද වේදනාවන්
අහිංසක ගැමි ජීවිතේ මැනෙයි පියවර මේ බිමේ
පිදුරු සෙවි කල පැල්පතේ ඇති සාමෙ නැත මහ මන්දිරේ

වියෝගිනි මැද දැවෙන ජීවිත අද වගේ හෙට හමු නොවේවා
සමාදානය සැබෑ ආලය දිනෙන් දින මතුවී පෙනේවා
මේ බිමට නොවෙනස්ව ඉර හඳ සෑමදා රැස් කිරණ දේවා
(පිදුරු සෙවි කල පැල්පතේ ඇති සාමෙ නැත මහ මන්දිරේ)//
ටිකිරි හසරැල් බොළඳ සිතිවිලි (මෙහි තිබේ හොඳ ආදරේ)//
මෙහි තිබේ හොඳ ආදරේ  මෙහි තිබේ හොඳ ආදරේ

x

177 - චන්ද්‍රා මේ රෑ පායා - එච්. ආර්. ජෝතිපාල

(චන්ද්‍රා මේ රෑ පායා ආවා - හරදේ පෙමින් නාව නාවා
මේ ආදරේ වාසනාවන් - දුක් වේදනාවන් නිවේවා)//

ඔබගේ සිනාවෙන් මුලාවී මේ රෑ පවා මල් පිපේවී
රන් තාරකාවෝ සිනාසී ප්‍රේමේ අමා ගී ගයාවී
ආශාව ආවාද මෝරා හැමදාම ඔබ මාගෙ වේවා

චන්ද්‍රා මේ රෑ පායා ආවා - හරදේ පෙමින් නාව නාවා
මේ ආදරේ වාසනාවන් - දුක් වේදනාවන් නිවේවා

(සතුටයි සැපයි ඔබය මාගේ ඔබ පෙම්වතී පෙම්වතාගේ)//
අරගන්න ඔය දෑත හුරතල් දෙදෙවේ මගේ පිහිට වේවා

(චන්ද්‍රා මේ රෑ පායා ආවා - හරදේ පෙමින් නාව නාවා
මේ ආදරේ වාසනාවන් - දුක් වේදනාවන් නිවේවා)//

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

178 - සඳ හිරු තරු - වික්ටර් රත්නායක

(සඳ හිරු තරු පවතින තුරු අපි මැරෙන්නෙ නෑ
අනඟ තරුණ බමරු අපී අමර වරම අපට හිමී
අපි මැරෙන්නෙ නෑ  අපි මැරෙන්නෙ නෑ)//

(කලක මෙහෙන් චුත වෙනවා)// (එලොව ගිහින් වැජඹෙනවා)// x2
පෙලපත නම වෙනස් වෙලා ආයෙත් මෙලොවට එනවා
එහෙම මිසක් කිසිම දිනක අපි මැරෙන්නෙ නෑ
සඳ හිරු තරු ...

(හැරමිටියෙන් ඇවිදින්නෝ)// (අපට එරෙහි වී එන්නෝ)// x2
සීමා මායිම් වැටකොටු මේ කිසිවක් අපට නැතේ
වැරදීමෙන් හුස්ම ගියත් අපි හඬන්නෙ නෑ

(සඳ හිරු තරු පවතින තුරු අපි මැරෙන්නෙ නෑ
අනඟ තරුණ බමරු අපී අමර වරම අපට හිමී
අපි මැරෙන්නෙ නෑ  අපි මැරෙන්නෙ නෑ)//

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

179 - සිරිපාදේ සමනොල - වින්සන්ට් පෝල් පීරිස්

(සිරිපාදේ සමනොල කන්ද පෙනේ ආලෝකය සමන් කුලේ
හඳපානේ මහ වන දිගා බලා සුදු රිදී කඳන් හමුවේ)//

(අර මහ මළුවේ සිරිපාද පියුම් වැඳ සාදු කියා එනවා)//
(නාදෙ ඇසෙන්නේ ඒ ඝන්ඨාරෙ මේ උතුම් පෝදා..මේ උතුම් පෝදා)//
(කරුණාවයි දෙව්දේ ... මේ සමන් සුරිදේ)//
(නාදෙ ඇසෙන්නේ ඒ ඝන්ඨාරෙ මේ උතුම් පෝදා..මේ උතුම් පෝදා)//

(අර මහ මළුවේ සිරිපාද පියුම් වැඳ සාදු කියා එනවා)//
(නාදෙ ඇසෙන්නේ ඒ ඝන්ඨාරෙ මේ උතුම් පෝදා..මේ උතුම් පෝදා)//
(කරුණාවයි දෙව්දේ ... මේ සමන් සුරිදේ)//
(නාදෙ ඇසෙන්නේ ඒ ඝන්ඨාරෙ මේ උතුම් පෝදා..මේ උතුම් පෝදා)//

(සිරිපාදේ සමනොල කන්ද පෙනේ ආලෝකය සමන් කුලේ
හඳපානේ මහ වන දිගා බලා සුදු රිදී කඳන් හමුවේ)//

x

(රාණී එන්කෝ නැගී මපෙම් රාජයා උනීය මා ලොවේ උතුම්
ප්‍රේමයේ නුරා රසේ බිබී තුටින් රාණි හා විදින්න ලෝ සැපේ උතුම්)//

ඕ..... සීතාවේ ඔයා උතුම්වූ ප්‍රේමයේ
ඕ..... රාම රාජයා ඔබයි මගේ ප්‍රියේ
රාවණා පරාද වී ගියා ඔබෙන්
රාණී එන්කෝ නැගී මපෙම්
ප්‍රේමයේ නුරා රසේ බිබී තුටින් රාණි හා විදින්න ලෝ සැපේ උතුම්

ඕ..... ප්‍රේමයේ සුලං වැදීලා මාලතී
ඕ..... පුෂ්පයා නැගී ශ්‍රියාව නැවෙතේ
ප්‍රීතිවී ගයයි සැම හා කියන්
රාණී එන්කෝ නැගී මපෙම්
ප්‍රේමයේ නුරා රසේ බිබී තුටින් රාණි හා විදින්න ලෝ සැපේ උතුම්

ඕ..... මා ඔබේය ජීවිතේ පුරා ප්‍රියේ
ඕ..... ඔබ මගේය නෑ සැකා විවාහයේ
ප්‍රේමේ පුදා ජීවිතේ රකිම්
රාණී එන්කෝ නැගී මපෙම්
ප්‍රේමයේ නුරා රසේ බිබී තුටින් රාණි හා විදින්න ලෝ සැපේ උතුම්

X

181 - ටිකිරි මැණිකෙ - මොහිදීන් බෙග්

(ටිකිරි මැණිකෙ ඇඹුල ගෙනල්ලා ගොවිරාල ගොඩට ඇවිල්ලා)//
ටිකිරි මැණිකෙ ඇඹුල ගෙනල්ලා

(ගලන දොලෙන් ඇග සෝදාලා කිරල ගහේ හෙවනට වීලා)//
නෙළුම් කොලේ එතන තියාලා ටිකිරි මැණිකෙ ඇඹුල බෙදනවා
ටිකිරි මැණිකෙ ඇඹුල ගෙනල්ලා ...

(නියර දිගේ ගොවියෝ එනවා බෙදන ඇඹුල රස කර කනවා)//
ඔමරි හිනා හඬ පැතිරෙනවා මුලු ගමටම කිරි ඉතිරෙනවා

ටිකිරි මැණිකෙ ඇඹුල ගෙනල්ලා ...

x

182 - දිසාපාමොක් ඇදුරුතුමණී - වී. එම්. ජයරත්න

දිසාපාමොක් ඇදුරුතුමණී
දුටුවදා සිට මනමේ කුමරී
ඇගේ රුව මා මනස කලඹයි
තක්සලාවෙන් ඉවත යන්නෙමි

තුරුණු ලැමහස වැටුණු වරලස
පොතට නොව වෙන අතට යයි සිත
ඇයද කිවිඳුන් කියන සුරලිය
සිතැඟි විහඟුන් සොයති නිදහස
දිසාපාමොක් ඇදුරුතුමණී ...

ලියන අටුවා කතා විවරණ
සැලෙන හදකට කුමන ශිල්පද
ඉතින් ගුරු සිත නොරිදවා යමි
වෙනත් පෙදෙසක ශිල්ප සෙවුමට
දිසාපාමොක් ඇදුරුතුමණී ...

X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 183 - ගමෙන් ලියුමක් - ක්ලැරන්ස් විජේවර්ධන

(ගමෙන් ලියුමක් ඇවිල්ලා අක්කගෙන් වාගේ
මොකක් කියලාද දන්නෑ එහෙ ගියෙත් නෑනේ)//

පහළ කුඹුරේ නිල් ගොයම් දැන් හරිම සරු සාරයි
වැසි වැටී වැව් ලිං පිරීලා හරිම සිරියාවයි
තවත් ආරංචී ගොඩයි ලියන්නට ලැජ්ජයි

ගමෙන් ලියුමක් ඇවිල්ලා අක්කගෙන් වාගේ
මොකක් කියලාද දන්නෑ එහෙ ගියෙත් නෑනේ

ගෙදර අය සතුටින් සිටින්නේ මල්ලි දැකගන්නයි
කාලෙකින් මෙහෙ ආවෙ නෑනේ වැඩත් වැඩි වෙන්නයි
ලඟදි එනවානම් හොඳයි නිවාඩුව දැන් දැන් ලඟයි

(ගමෙන් ලියුමක් ඇවිල්ලා අක්කගෙන් වාගේ
මොකක් කියලාද දන්නෑ එහෙ ගියෙත් නෑනේ)//

X

184 - හන්තානේ කඳු - අමරදේව

හන්තානේ කඳු මුදුන සිසාරා පවනක් වී එන්නම්
ඔබේ සුවඳ රැඳි කුටිය සමීපේ (කුසුමක් වී ඉන්නම්)//

තුන් මහලින් සැදි සරසවි පාරේ මල් කැටයම් සෙවනේ
සිරිපොද වැස්සේ නැගුනු සතුටු රල මිරිඟු සයුර මෙනි අතීතයේ
මිරිඟු සයුර මෙනි අතීතයේ

හන්තානේ කඳු මුදුන සිසාරා ...

පාලු නිසංසල කඳුවැටි අතරේ මහවැලි ගං ඉවුරේ
අත්තටු සිඳගත් විහඟ විලාසෙන් අපේ පැතුම් ඉකි බිඳිනු ඇසේ
අපේ පැතුම් ඉකි බිඳිනු ඇසේ

හන්තානේ කඳු මුදුන සිසාරා ...

x

185 - සාරි පොඩිත්තක් - නන්දා මාලිනී

(සාරි පොඩිත්තක් ඇඳගෙන මාල පොඩිත්තක් බැඳගෙන
දිග පොඩිත්තක් යන්නට කතා කරාවී
කතා කරල මංගල්ලේ නියම කරාවී)//

(රණ්ඩු කරල සිංදු කියල තොරන් බැඳල රැහැන් ඇදල)//
පාවඩ පිට මනාලයා ගෙදරට එවී
(ගෙදර ඇවිත් ලැජ්ජාවෙන් මුකුළු කරාවී)//

සාරි පොඩිත්තක් ඇඳගෙන...

(තක්කිට තරිකිට කියලා තිරික්කලේ අපි යනකොට)//
අහල පහල ඉන්න ඇයො බලා හිඳීවී
(බලා ඉඳල අපි දෙන්නට විහිළු කරාවී)//

සාරි පොඩිත්තක් ඇඳගෙන...

(එතනො සුමනො නාඩ ඉඳින් සිකුරු තරුව පායනකන්)//
ඔයාලටත් පිරිමි කෙනෙක් බැල්ම හෙලාවී
(බැල්ම හෙලල තවත් ගමක් එලිය කරාවී)//

X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

186 - හිරුගේ ලොවේදී - ක්ලැරන්ස් විජේවර්ධන

(හිරුගේ ලොවේදී අපි වෙන්වෙමු
සඳුගේ රැයේදී යලි හමුවෙමු
යලි හමුවෙමු)//

සැකයේ වෙලීලා උදයේ හවා
වැටවල් නැගේ අප වටා
ගොළුවී මුවාවී ඉමු
හිරුගේ ලොවේදී ...

අඳුරේ එතීලා රැය සීතලේ
සිහිනේ උදාවූ ලොවේ
මුමුනා හිනාවී ඉමු
හිරුගේ ලොවේදී ...

X

187 - සුදූ හාමිනේ - නන්දා මාලිනී

සුදූ හාමිනේ නුඹ කොතැනද අද දවසේ
දීගෙක ගිහින් දරු පිරිවර මැද සුවසේ
ලේලිය කැටුව මගෙ පුතු වෙන්විය රහසේ
මං විතරයි තනියම දැන් මගෙ නිවසේ

උඹලගෙ තාත්තා ඈත දුර බලාගෙන
කවදා දූ පුතුන් එ දැයි පතාගෙන
වේවැල් කැඩුනු පුටුවේ වක ගසාගෙන
මං ඉන්නවා නෙතු කඳුලැලි දරාගෙන

දරුවන් ඇඳුම් ඇඟලුම් ගෙන සිඹින්නෙමී
මනසින් එදා කෙලි සෙල්ලම් දකින්නෙමී
මරණයෙ දොරකඩට සපැමිණ සිටින්නෙමී
ලේ කිරි පෙවූ දරුවන් දැක මියෙන්නෙමී

සුදූ හාමිනේ නුඹ කොතැනද අද දවසේ
දීගෙක ගිහින් දරු පිරිවර මැද සුවසේ
ලේලිය කැටුව මගෙ පුතු වෙන්විය රහසේ
මං විතරයි තනියම දැන් මගෙ නිවසේ

X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 188 - සන්නාලියනේ - අමරදේව

සන්නාලියනේ // මේ හිමිදිරි උදයේ
සන්තෝසෙන් ඔබ හිනැහී හිනැහී (කාටද ඇඳුම වියන්නේ) //
මාල ගිරා තටු සේම රැවින් යුතු නිල්වන් ඇඳුම වියන්නේ
කාටද ඇඳුම වියන්නේ
මාල ගිරා තටු සේම රැවින් යුතු නිල්වන් ඇඳුම වියන්නේ
ඊයේ ඉපදුනු කුළුඳුල් දූටයි මේ පොඩි ඇඳුම වියන්නේ

සන්නාලියනේ // මේ හැන්දෑ යාමේ
හැඩ වැඩ දමලා ලස්සන කරලා (කාටද ඇඳුම වියන්නේ) //
සැන්දෑ අහසේ රන්වන් පාටින් දිලිසෙන ඇඳුම වියන්නේ
කාටද ඇඳුම වියන්නේ
සැන්දෑ අහසේ රන්වන් පාටින් දිලිසෙන ඇඳුම වියන්නේ
ඒ කුළුඳුල් දූ දීගෙක දෙන්නයි මංගල ඇඳුම වියන්නේ

සන්නාලියනේ // සීතල හඳ එළියේ
මැලැවුනු මුහුණින් වෙව්ලන දෑතින්
කාටද සළුව වියන්නේ සීතල සළුව වියන්නේ
කණකොක් තටුවේ සුදුමැලි පාටින් සීතල සළුව වියන්නේ
කාටද සළුව වියන්නේ
කණකොක් තටුවේ සුදුමැලි පාටින් සීතල සළුව වියන්නේ
මියගිය ඇයගේ මිණිය වහන්නයි සීතල සළුව වියන්නේ
X

## 189 - පැලේ වසන රන්මලී - සිඩ්නි ආටිගල

(පැලේ වසන රන්මලී මගේ සොඳුරු සිරිමලී
ඔබේ මියුරු ගී ඇසේ ඇසේ මම සොයා එමී රන්මලී)//

(වෙලේ දිලෙන රන් ගොයම් කරල් ඔබේ හඬට යයි නැමී)//
(වනේ පිපෙන මල් සිනාසිසී ඔබේ දෙපා පොඩි සිඹී)//

ඇගේ සුමුදු රන්මලී එපා වුනත් සිරිමලී
ඔබේ මියුරු ගී ඇසේ ඇසේ මම සොයා එමී රන්මලී

(ඔබේ දිලිඳුකම යටයි සුදෝ සැබෑ සොඳුරු ගුණ නිසා)//
(ඔබේ සිනාවන් අගෙයි මටා හෙලේ ඔටුන්නට වඩා)//

විලේ සොඳුරු රන්මලී එපා වුනත් සිරිමලී
ඔබේ මියුරු ගී ඇසේ ඇසේ මම සොයා එමී රන්මලී

x

190 - උඩරට කඳුකර - චිත්‍රා සෝමපාල

(උඩරට කඳුකර සිරියා පරදන රෑබර මුහුණ ඔබේ
රතැඟිලි දිගුකර මදහස නංවන තේ දළු නෙලන ලදේ)//

රට පන ගන්වන ජාතිය සුරකින ජාතික ධනය අපේ
අපි ණය ගැති වෙමු සුකොමල දෑතට තේ දළු නෙලන ලදේ
උඩරට කඳුකර සිරියා ...

ලියලන දළු වල කරටිය හැමවිට ඔබෙ නෙත් දෙකට නැමේ
දනමන පිනවන ඉම්හිරි පානෙකි පිටරට යවන අපේ
උඩරට කඳුකර සිරියා ...

සේවය යහපත ලොවටම සලසන කම්කරු ලඳකි ගමේ
ලංකා පොලවේ පැලවෙන තේ ගස ඔබෙ දිවි රකිනු ලැබේ
උඩරට කඳුකර සිරියා ...

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

191 - මුව හසරැලි සාගරේ - ක්ලැරන්ස් විජේවර්ධන

මුව හසරැලි සාගරේ මුතුවැලක් වෙලා
නෙත් අඹරේ පායනා තරු දෙකක් වෙලා
දේදුන්නක සඟවලා දෙතොල් රතු කලා
ඔබ මගෙ මුළු ජීවිතේ රඟ හලක් කලා

සඳ විමනේ විසිතුරු පවසා
නෙත් එලියෙන් තොරතුරු විමසා
පිය වදනෙන් සළු වත දවටා
සැනසිල්ලේ උණුසුම ගවසා
ඔබ නලවන්නම් ඔබ සනසන්නම් //
නොමියෙන සුලු ආදරයක කතා කියන්නම්

මුව හසරැලි සාගරේ ...

සඳ විමනේ සොමි ගුණ මවලා
දේදුන්නක සිසිලස ගොතලා
මල් කෙමියක මදු රස සොයලා
සල් අරණක පවනැලි නිවලා
ඔබ නලවන්නම් ඔබ සනසන්නම් //
නොමියෙන සුලු ආදරයක කතා කියන්නම්

මුව හසරැලි සාගරේ ...X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

192 - සුදු සඳ රැස් ගලන - මොහිදීන් බෙග්

(සුදු සඳ රැස් ගලන ගංගාවෙ පිහිනා) //
සිහින විමානෙදි හමුවෙන්න ඕනා
(සුදු සඳ රැස් ගලන ගංගාවෙ පිහිනා) //

(පහනක් ලෙසින් මගෙ ජීවන කුටියේ)//
(සොඳුරිය පමණයි තනියට සිටියේ)//
දේව දුවේ මුව හසරැලි පානා
(සුදු සඳ රැස් ගලන ගංගාවෙ පිහිනා) //

(සහකාරිය කර කිරුළ පලන්දා )//
(ගෙනඑම් සුදු මගෙ නිවසට කැන්දා)//
සිරි දේවිය මගෙ සුර සැප ගේනා
(සුදු සඳ රැස් ගලන ගංගාවෙ පිහිනා) //
සිහින විමානෙදි හමුවෙන්න ඕනා
(සුදු සඳ රැස් ගලන ගංගාවෙ පිහිනා) //

x

## 193 - සිරි යහනේ - එඩ්වඩ් ජයකොඩි

සිරි යහනේ ලණු ඉහිරී සුසුම් හෙලන රෑ
මකුළු දැලින් සිරි සිරියේ වියන් බඳින රෑ
(යටලීයෙන් නාරිලතා මල් පුදින්නේ)// x2

සඳෙන් සඳට මුවාවෙලා කල දවසත් ගෙවී ගිහින්
නෙතට නුහුරු කඳුළු බිංදු පැදුරට මුහුවෙලා හොරෙන්
(යටලීයෙන් නාරිලතා මල් පුදින්නේ)//
සිරි යහනේ ලණු ඉහිරී සුසුම් හෙලන රෑ
මකුළු දැලින් සිරි සිරියේ වියන් බඳින රෑ
(යටලීයෙන් නාරිලතා මල් පුදින්නේ)//

යහන තලා සැප විඳිනා පලඳී නැතුවා පෙර පින්
මාල වලලු නොතිත් අයට අප අමතක වෙලා ගොහින්
(යටලීයෙන් නාරිලතා මල් පුදින්නේ)//
සිරි යහනේ ලණු ඉහිරී සුසුම් හෙලන රෑ
මකුළු දැලින් සිරි සිරියේ වියන් බඳින රෑ
(යටලීයෙන් නාරිලතා මල් පුදින්නේ)//

X

194 - අකුරු මැකී නෑ - එඩ්වඩ් ජයකොඩි

(අකුරු මැකී නෑ කොල ගැලවී නෑ බොඳවී නෑ සිතුවම්
ඉස්සර වාගේ තාමත් මතකයි හෝඩි පොතේ පාඩම්)//

මේ ඊරී බිම සීරී කුමුදුමතී හිස පීරී
දීසිය පුරවා දෝසි දමා කුමුදුමතී හිනැහේවී
අකුරු මැකී නෑ ....

අපි දුවමු අපි පනිමු ගී කියමු අපි නටමු
ඇත් පොරයට අපි ඇඟෑ යවමු බාල වියට පා නගමු
අකුරු මැකී නෑ ....

x

195 - රන් ටිකිරි සිනා - නීලා වික්‍රමසිංහ

(රන් ටිකිරි සිනා මුව මුව පාලා
ලංවී අත් අල්ලාගෙන ඇස් දැල්වුවා)//

දැතේ බැඳිලා ඇතට දුවලා
නොපෙනී යනවද සුදූ නංගී
ඉනිමං නැගලා ලස්සන හොයලා
ගමනක් යනවද සුදූ මල්ලී

(රන් ටිකිරි සිනා මුව මුව පාලා
ලංවී අත් අල්ලාගෙන ඇස් දැල්වුවා)//

බාලේ ගෙවලා ආලේ දුරැලා
නොපෙනී යනවද සුදූ නංගී
දඟකර සිටලා ගංතෙර හැරදා
ගමනක් යනවද සුදූ මල්ලී

(රන් ටිකිරි සිනා මුව මුව පාලා
ලංවී අත් අල්ලාගෙන ඇස් දැල්වුවා)//

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

196 - බින්දු බින්දු රන් - අමරදේව

බින්දු බින්දු රන් ගෝමර මාලා
බන්දා ගෙල වට ඔමරි ලතාවට
කන්දෙන් පාවී
කන්දෙන් පාවී ලන්දට බසිනා
රන්වන් රන්වන් - මගෙ රන් කිකිළී
(රන්වන් රන්වන් රන් කිකිළී)// x 2

හුරුනැති මඟක ගොස් උගුලක වැටෙනු එපා
කළුවර ගලද්දී තනිමග ඇදෙනු එපා
සිරිකත මැවූ සිරි දෙනයන මකනු එපා
පිරිවර සොයා මා තනිකර යන්න එපා

කුන්ද සමන් පෙති සුවඳ හලාලා
රන් හිරුරැස් කෙදි දෙරණ සිඹින විට
මන්දැයි තවමත්
මන්දැයි තවමත් ලන්දට නාවේ
රන්වන් රන්වන් - මගෙ රන් කිකිළී
(රන්වන් රන්වන් රන් කිකිළී)// x 2

x

චන්දන ඇල්ලෙන් නාලා අංජන මල් මී ගාලා
හැංගුන බඹරා ආවා ලස්සන රහසක් කීවා
චන්දන ඇල්ලෙන් නාලා

මලට මුවාවී ඉන්නේ මල් පෙති යට සැඟවෙන්නේ
හදකට තුරුළුව ඉන්නේ ලෝකය නෑ එය දන්නේ
චන්දන ඇල්ලෙන් ...

එක කුසුමකි පිබිදෙන්නේ එක වන බමරෙකි ඉන්නේ
දෙබරුන් සේනා එන්නේ වෙනසක් නෑ සිදූවන්නේ
චන්දන ඇල්ලෙන් ...

දගසක් නෙත් යොමුවන්නේ එනමුත් නෑ හදූනන්නේ
ඇසිපිය යට සැඟවෙන්නේ සිහින ලොවේ හමුවන්නේ
චන්දන ඇල්ලෙන් ...

X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

198 - පින්න මලේ සුද - එඩ්වඩ් ජයකොඩි

(පින්න මලේ සුද ඇන්න ගිහින්වද
මුහුණ පුරා පෙම් පිරිලා
ඉන්න එපා නුඹ හැන්දෑකරේ දොර
කන්ද කපා හඳ ගෙට එන්නා)//

දූන්න වගේ නැමි බන්ඩි කුරක්කන්
අන්න බලාපන් අත වනතේ
මන්ද නගේ උඹ යන්නෙ ගමෙන් පිට
ගංදොර වෙල් එලි පාලු වෙතේ
පින්න මලේ ...

ඉන්නෙ මොකෝ වැට ඉන්න වගේ උඹ
එන්නෙ අළුත් අවුරුදු කාලේ
ගන්න එපා පරදේශ සිරිත් එක
මේක අපේ සිංහල දේසේ
පින්න මලේ ...

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

199 - රෑ පැල් රැකලා - සී. ටී. ප්‍රනාන්දු

(රෑ පැල් රැකලා පැල් කවි කියලා නිදි නැති දෙනෙත බරයි
වෙහෙස නිවන්නට තුරුලිය නලවා එන මඳ පවන සුවයි)//

බොල් පිනි මකලා හිරු රැස් වැටිලා මැණික් ලෙසින් දිලිසේ
මට බහඳුන් දා විලියෙන් ඇඹරුනු මැණිකගෙ නෙත් විලසේ

මෙදා සැරේ කුරහන් කිරි වැදිලා සුලඟේ ලෙල දෙනවා
කුඹුකෙන් නාගෙන වරල විදා යන මැණිකෙව සිහි වෙනවා

රෑ පැල් රැකලා ...

ගොවිතැන් සාරයි එකෙන් නැහැ නොවැ අතමිට අඩු පාඩු
පළඳන්නම් ගෙල මාල සවන් යුග ලෙලවම් රන් තෝඩු

ගේ පොඩියෙත් වැඩපොල අවසන් මුත් එලියක් එහි නෑ නේ
මේ කන්නයේදිම අස්වනු කැපුවම මැණිකෙත් එනවානේ

රෑ පැල් රැකලා ...

x

200 - කුන්ඩුමණී - ෆ්‍රෙඩී සිල්වා

මන්නාරම් පිටිවැල්ලේ මදට්ටිය වැල් ඔන්චිල්ලේ
කොන්ඩෙ කඩන් හදට අඬන් සිංදු කියන්නේ
කුන්ඩුමණී (කුන්ඩුමණී ... කුන්ඩුමණී)//

නැහැයෙ කරාබුව දෙකනේ කඩුක්කන් දමා සියොලඟ
මොට්ටැක්කිලියෙන් හැඩකොට වසා ඉඟ නමා
උළුදු කොටා තල වේලා තල්පත මත ගිනි අව්වේලා
කුන්ඩුමණී
සෙම්බු කලේ උකුලෙ හොවා ආඩි ලිඳෙන් දිය ඇදලා
ලුනු පාත්තියට දමා විඩාපත් වෙලා
හැන්දෑවට කෝවිල් ගොස් පොල් ගහලා නළලේ අලු ගා ...
කුන්ඩුමණී (කුන්ඩුමණී ... කුන්ඩුමණී)//

ගොම ඉහලා හැදූ ගෙබිම පිච්ච මලෙන් සරසාලා
කෙසෙල් ගස් දෙකක් දොරකඩ සිටුවා තබලා
කොම්බු ඔටම් මෘදංග නද මුලු ගමටම හඬවා දීලා ...
කුන්ඩුමණී
සන්ඩු කරල බැනුම් අහල හැංගි හැංගි බැන්ද ප්‍රේමෙ
මහරාජා ආකල ගෙට තිරික්කලෙන් බැසලා
කුන්ඩුමණී යන පෙරහැර බලා ඉදිම් කීකරු වීලා ...
කුන්ඩුමණී (කුන්ඩුමණී ... කුන්ඩුමණී)//
මන්නාරම් පිටිවැල්ලේ ....
x